වයඹ පළාත් සභාව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

වයඹ පළාත් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 වර්ෂයේ දී ගිනිතබා විනාශ කර තිබූ ආණ්ඩුකාරවර කාර්යාලය සතුව පැවති රු.24,970,000 ක් වටිනා ලෑන්ඩ් රෝවර් ඩිස්කවරි රථයේ පිරිවැය කපා හැරීම සඳහා අනුමැතිය ලබා නොදීම හේතුවෙන් තවදුරටත් දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබූ අතර, ඒ සම්බන්ධයෙන් ගිණුම්වල අනාවරණය කර නොතිබුණි.	ලේඛනවලින් ඉවත් කිරීමට ප්‍රධාන ලේකම් වෙතින් අනුමැතිය ලබා දී නොමැති බැවින්, ගිණුම් ඒකක ගැලපීම් යටතේ වාහනයේ ඉවත් කළ වටිනාකම නැවත ඇතුළත් කර ඇති බව.	සත්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.

(ආ)	වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ එකතුව රු.16,956,802,973 ක් වූ වත්කම් කාණ්ඩ 06 ක ශේෂයන් තහවුරු කර ගැනීම සඳහා වූ ස්ථාවර වත්කම් ලේඛන හා උප ලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	2024 වර්ෂයට අදාළ ශේෂ සඳහා අදාළ ලේඛන ලිපි ගොනුවෙහි අමුණා ඇති බව හා 2024 වර්ෂයේ ගෘහ භාණ්ඩ, විද්‍යුත් උපකරණ සඳහා වියදම් කර නොමැති බව.	අදාළ ලේඛන යාවත්කාලීන කර උපලේඛන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් 31 ක් තක්සේරු නොකිරීම හා ආයතන 35 ක ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය නොකිරීම හේතුවෙන් ගිණුම්ගත කර නොතිබුණි.	තක්සේරු දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය වී කඩිනමින් තක්සේරු වාර්තා ලබාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කරන බව.	ඉඩම් හා ගොඩනැගිලිවල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව වයඹ පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම

මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 ශීර්ෂය 202 - පළාත් සභාව

1.5.1.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	**අනුකූල නොවීම**	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි	කාර්යාලයේ ප්‍රයෝජනයට ලබා දී තිබූ අංක 253-6132 දරන වාහනය 2002 ඔක්තෝබර් 11 වන දින	මේ වන විටත් මෙම නඩු තීන්දුව පිළිබඳ වාර්තාවක් නොලැබුන බැවින්, 2005 මාර්තු 01 දිනැති අලාභය	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.

සංග්‍රහයේ 104(4) වැනි රෙගුලාසිය	සම්පූර්ණයෙන්ම ගිනි ගෙන විනාශයට පත් වීමෙන් සිදු වී තිබුණු අලාභය සම්බන්ධයෙන් පත්කර තිබුණු පරීක්ෂණ මණ්ඩලයේ 2005 මාර්තු 01 දිනැති අවසාන වාර්තාව අනුව අලාභය රු.550,000 ක් වුවද, එම අලාභය අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	සම්බන්ධ වාර්තාව අනුව අලාභය අය කර ගැනීමට අවස්ථාවක් ලැබී නොමැති බව.

1.5.2 ශීර්ෂය 210 - වයඹ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලප්‍රවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යවරයා.

1.5.2.1 නිති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	**අනුකූල නොවීම**	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19(2) වගන්තිය	පළාත් සභා අරමුදලේ මුදල්, පනතේ විධිවිධාන සලසා ඇති කාර්ය සඳහා හැර වෙනත් කාර්යයන් සඳහා ප්‍රයෝජනයට නොගත යුතු වුවද, ඊට අනුකූල නොවන පරිදි පළාත් සභා අරමුදල් රු.මි.150 ක් ප්‍රධාන අමාත්‍යාංශය හරහා කුරුණෑගල මහා නගර සභාවේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියකට අදාළ වැට් බද්ද මුදලක් කොන්ත්‍රාත්කාර ආයතනය වෙත ගෙවීම් කිරීම සඳහා ලබා දී තිබුණි.	පළාත් සභාව නොමැති අවස්ථාවක පළාත් සභාවේ ප්‍රධාන මූල්‍ය හා පරිපාලන බලධාරියා වශයෙන් සිටින වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත රුපියල් මිලියන 150 ක අත්තිකාරම් මුදල පළාත් සභා අරමුදලින් කුරුණෑගල මහ නගර සභාව වෙත ලබා දී ඇති බව.	පළාත් සභා අරමුදල්, පනතට අනුකූලව හා පනතේ විධිවිධාන සලසා ඇති කාර්යයන්ට වැය කළ යුතුය.

1.5.2.2 අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයන් නිවැරදිව සිදු නොකිරීම හේතුවෙන් ජනකලා කේන්ද්‍රයේ ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා දරා තිබූ රු.209,673,158 ක වියදම මෙන්ම මෙම ගොඩනැගිල්ල නැවත ඉදිකිරීම් සඳහා 2021 හා සමාලෝචිත වර්ෂයේ දරා තිබූ රු.734,376 ක් පුවත්පත් දැන්වීම් පල කිරීම් වියදම් නිශ්කාර්යය වියදමක් බවට පත්ව තිබුණි.	ශ්‍රවණාගාරයේ 1 අදියර සඳහා රු.මිලියන 205,967 ක් ගෙවීම් කර ඇත. II අදියර සඳහා ශ්‍රවණාගාරය ඉදිකිරීම වෙනුවෙන් රුපියල් මිලියන 813 ක් ලෙස සලකා ප්‍රසම්පාදන කටයුතුද ආරම්භ කළ ද සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු හමු නොවීම හා කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් නැවත ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට අවකාශයක් නොවුණි. පසුව පැන නැගුණ මූල්‍ය අර්බුදය හමුවේ ඉදිකිරීම් අතරමග නතර කළ බව.	නිවැරදි ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය.

1.5.3 ශීර්ෂය 211 - වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව

1.5.3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
1995 හා 1996 වර්ෂවල වයඹ පළාතේ පළාත් පාලන ආයතනවල කටයුතු සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් නිකුත් කර තිබුණු රු.2,006,330 ක් වූ අධිභාර සහතික 03 ක් සම්බන්ධයෙන් 2024 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	පිළිගන්නා බව.	අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.4 ශීර්ෂය 212 - වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

1.5.4.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරී අදහස	නිර්දේශය
පස් හා රොන්මඩ ඉවත්කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘති කාර්යාලය අතර මනා සම්බන්ධතාවයක් සිදු නොවීමෙන් පස් හා රොන්මඩ නිසි පරිදි භාරදීම්, භාරගැනීම් හා වෙන්දේසි කිරීම් සිදුනොවී ඇති අතර ඒ හේතුවෙන් රජයට ලබාගත හැකිව තිබූ රු.6,784,392 ක ආදායමක් අහිමිව තිබුණි.	සුහුරු වාරි ව්‍යාපෘතිය ආරම්භයේදී පස් හා රොන් මඩ ඉවත් කිරීම පැහැදිලි උපදෙස් ලබා දී නොතිබුණි. ඒ අනුව ඉවත් කරන ලද පස් වැව් ආසන්නයේ ගොඩගසා තිබීම හේතුවෙන් පස් ඉවත් කිරීමේ කටයුතු වලටද බාධාවන් සිදු වූ බැවින්, ගොවිජන සේවා මධ්‍යස්ථානය දැනුවත්කර ඔවුන්ගේ නිර්දේශය පරිදි පස් ඉවත් කළ බව.	ව්‍යාපෘතිය ඉටුකිරීමේදී ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යා යුතු අතර රජයට වාසිදායක වන ආකාරයට කටයුතු කළ යුතුය.

1.5.5 ශීර්ෂය 213 - වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1.5.5.1 නිති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

	නිති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පළාත් මූල්‍ය රීති 54	2021 වසරේ සිට කු/ශුද්ධ වූ පවුලේ බාලිකා විද්‍යාලයේ සිදු වී තිබුණු මූල්‍ය වංචාව සම්බන්ධයෙන් වූ වාර්තාව අනුව 2021, 2022 වර්ෂවල පාසල් සංවර්ධන සමිතියේ මුදල් රු.3,285,000 ක් හා පරිත්‍යාග මුදල් රු.50,000 ක් ලෙස මුළු එකතුව රු.3,335,000 ක් බැංකු ගතකර නොතිබූ බව තහවුරු කරගෙන තිබූ අතර, පසුව එම මුදල්	කොරෝනා වසංගතය හේතුවෙන් පාසල් කඩින් කඩ පැවැත්වීම නිසා උක්ත අධ්‍යයන වර්ෂවලදී පාසල් ගුරුවරුන්ගේ හා පාසල් සිසුන්ගේ පැමිණීම අඛණ්ඩ සිදු නොවීම හා කාර්යාල කටයුතු කඩින් කඩ සිදු වීම, ගුරුවරුන්ගේ නිරෝධායන කටයුතු, පාසල් ගුරුශිෂ්‍ය සෞඛ්‍ය තත්ත්වය නගා සිටු වීමට විවිධ වැඩසටහන් සිදු කිරීමේ වගකීම වැනි	මූල්‍ය වංචා සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණ පවත්වා අදාළ පාර්ශවයන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

		හඳුනාගත නොහැකි ලැබීම් ලෙස සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයේ රු.1,600,000 ක් සහ මැයි මාසයේ දී තවත් රු.1,735,000 ක් ලෙස පාසල් සංවර්ධන සමිති ගිණුමට බැර කර තිබුණ ද මෙම තාවකාලික මුදල් වංචාවට වගකිව යුතු නිලධාරීන් පිළිබඳව විනය පියවර ගෙන නොතිබුණි.	වගකීම් සහගත රාජකාරී සමූහයක් විදුහල්පතිනිය වෙත පැවරී තිබූ නිසා මෙවැනි තත්ත්වයක් උත්ගත වී ඇති බව.	
(ආ)	2017 මාර්තු 29 දිනැති අංක ED/04/60/01/වි.දීමනා / 2017 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියේ 02 වගන්තියෙන් සංශෝධිත 2017 මාර්තු 14 දිනැති අංක 16/2017 චක්‍රලේඛය	විදුහල්පති තනතුරු වැඩබලන දීමනාව ලබා දිය යුතු වන්නේ විදුහල්පති තනතුරක නිත්‍ය ලෙස රාජකාරී කරනු ලබන හෝ එම තනතුරක වැඩ බලන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ , හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1, 2 හා 3 පන්තියේ වරප්‍රසාද හිමි නිලධාරීන්ට පමණක් වුවද, ඊට අනුකූල නොවන පරිදි වයඹ පළාත් කලාප අධ්‍යාපන කාර්යාල 08 හි වැඩබලන ගුරු සේවයේ ගුරුවරුන් 199 දෙනෙකුට රු.35,572,900 ක දීමනා ගෙවීම් කර තිබුණි.	විදුහල්පතිවරුන්ගේ ඌනතාවය නිසා වැඩ බැලීම සඳහා විදුහල්පතිවරුන් පත් කර ඇති අතර, වැඩ බැලීමේ දීමනා ගෙවීම් කිරීම ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත සිදු කර ඇති බව.	විදුහල්පති සේවයේ නිලධාරීන් තුලනය කර විදුහල්පති ලෙස පත්වීම් කිරීමට කටයුතු කළ යුතු අතර, විදුහල්පති දීමනා ගෙවීමේදී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2019 පෙබරවාරි 25 දිනැති අංක 05/2019 දරන චක්‍රලේඛය	05 ශ්‍රේණි ශිෂ්‍යාධාර ගෙවීමේ මාර්ගගත වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ දී පාසල මඟින් සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය තොරතුරු පද්ධතියෙහි නිරවද්‍යතාව තහවුරු කර ගෙවීම් කටයුතු සඳහා අදාළ බැංකු ශාඛා වෙත යොමු කිරීම කලාප අධ්‍යාපන කාර්යාලයේ කාර්යයක් වුවද, ශිෂ්‍යත්වලාභීන්	පාසල් මඟින් ගිණුම් අංක ලබාගැනීමෙන් පසුව අදාළ මුදල් නිදහස් කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව.	කාල පමාවකින් තොරව ශිෂ්‍යාධාර ප්‍රතිලාභීන්ට එම මුදල් ලබා දීමට කටයුතු කළ යුතුය.

	නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු නොකිරීම තුළ 2022 අප්‍රේල් සිට සමාලෝචිත වර්ෂය දක්වා කලාප කාර්යාල 03 ක අවස්ථා 60 කට අදාළව රු.1,883,000 ක ශිෂ්‍යාධාර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.	

1.5.5.2 කාර්ය මණ්ඩල පරිපාලනය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කලාප කාර්යාල 08 ට අදාළව විදුහල්පති ශ්‍රේණියේ මුළු පුරප්පාඩු සංඛ්‍යාව 598 ක් වුවද, කුරුණෑගල කලාපයේ විදුහල්පති ශ්‍රේණියේ 57 දෙනෙකුගේ අතිරික්තයක් පැවතීමෙන් විදුහල්පති පුරප්පාඩු තුලනය කිරීමට කටයුතු කර නොතිබුණි.	2025 මැයි 26 දින සිට වයඹ පළාතේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට අදාළව ප්‍රධාන අමාත්‍යාංශය විසින් මේ වන විට කටයුතු කරමින් සිටින අතර අදාළ නාම ලේඛනය ප්‍රසිද්ධියට පත් කර ඇති බව.	අතිරික්ත විදුහල්පතිවරුන් තුලනය කිරීමට කටයුතු කළ යුතුය.

1.5.6 ශීර්ෂය - 220 වයඹ පළාත් සමුපකාර සංවර්ධන හා වෙළඳ, ඉඩම්, විදුලිබල හා බල ශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යවරයා

1.5.6.1 නිති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම	ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 ඔක්තෝබර් 05 දින සිට ක්‍රියාත්මක වයඹ පළාත් සමුපකාර සංවර්ධන අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද සමුපකාර අරමුදල කළමනාකරණය හා පරිපාලනය සඳහා වන	සමුපකාර සමිතිවල කාරක ප්‍රාග්ධන ඌනතා සඳහා අවශ්‍ය ණය පහසුකම් සැලසීම කළ යුතු වුවත්, 2024 වර්ෂයේ සී/ස කුරුණෑගල සමුපකාර ආරෝග්‍ය ශාලා සමිතියේ නව රෝහල් ගොඩනැඟිල්ලේ තෙවන	සමුපකාර අරමුදල කළමණාකරණය හා පරිපාලනය සඳහා වන කාර්ය පටිපාටි සංග්‍රහයේ 05 වන වගන්තියේ II (අ) වගන්තිය අනුව සිමාසහිත කුරුණෑගල සමුපකාර ආරෝග්‍යශාලා සමිතිය සඳහා	කාර්ය පටිපාටි සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය.

කාර්ය පටිපාටි සංග්‍රහයේ 05 වන වගන්තියේ ii (අ) වගන්තිය	අදියර ඉදිකිරීම සඳහා රු.151,941,687 ක් හා සී/ස පොල් ත්‍රිකෝණයේ කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතියේ සූර්ය බල ව්‍යාපෘතිය සඳහා රු.16,900,000 ක් වශයෙන් අළුත් ව්‍යාපෘති සඳහා ණය ලබාදී තිබුණි.	රු. 151,941,687 ක ණය මුදල සියයට 2.5 ක පොලි යටතේ ලබා දී ඇත. නව රෝහල් ගොඩනැගිල්ල ඉදි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ණය ලබා දී ඇත. සමුපකාර සංවර්ධන අරමුදලින් සියළුම ණය ලබා දෙනුයේ සමිතිවල කාරක ප්‍රාග්ධන සැලකිල්ලට ගෙන කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සැපයීම වෙනුවෙනි.

1.5.7 ශීර්ෂය 221 - සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

1.5.7.1 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

	නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම	ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1983 අංක 32 සහ 1992 අංක 11 දරන සමුපකාර සමිති සංශෝධන පනත් වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 58 හා 59 වගන්තිය	තීරක ආරවුලක් උසාවි බලගන්වා එක් රැස්කර ගන්නා ලද 2019 වර්ෂයේ සිට වසර 06 කට ආසන්න කාලයක් පැවත එන තවදුරටත් අදාළ සමිති හඳුනාගෙන නිදහස් නොකරන ලද 2024 දෙසැම්බර් 31 දින වන විට උසාවි දඩ මුදල් රු.58,298,132 ක ශේෂයක් කුරුණෑගල සහකාර කොමසාරිස් කාර්යාලය තුළ තවදුරටත් රඳවාගෙන පැවතුණි.	(I) මෙම වටිනාකම තුළ 2024 වර්ෂයේ නිදහස් කළ යුතු රු.47,610,432 ක ශේෂයක් ද අන්තර්ගත වී ඇත. (II) 2025 මාර්තු 31 දින වන විට පැවති සමස්ථ උසාවි දඩ මුදල වූ රු.138,559,741 ක මුදලින් 2024 ජූනි 29 දින සමුපකාර අරමුදලට බැර කරන ලද රු.22,500,000 ක මුදලට අමතරව 2024 දෙසැම්බර් 31 දිනෙන් පසු රු.75,373,309 ක	1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 58 හා 59 වගන්තිය ප්‍රකාර කටයුතු කළ යුතුය.

			මුදලක් සමිති වෙත නිදහස් කර ඇති බව.	
(ආ)	2018 ඔක්තෝබර් 04 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර 2091/63 මඟින් සංශෝධිත රීති මාලාවේ 43 (iv) වගන්තිය	සෑම ලියාපදංචි කළ සමිතියක්ම රෙජිස්ට්‍රාර් විසින් නියම කරන ලද පරිදි වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට 10 කට අඩු නොවන සහ රු.500 කට අඩු නොවන මුදලක් සමුපකාර අරමුදලට දායක මුදල් වශයෙන් වර්ෂයක් පාසා ගෙවිය යුතු වුවත්, කුරුණෑගල කොට්ඨාශ 08 ක සමුපකාර සමිති 219 කින් දායක මුදල් ලෙස 2024 දෙසැම්බර් 31 දින වන විට රු.24,252,187 ක මුදලක් හා, හලාවත කොට්ඨාශයේ කලාප 12 හි සමිති වලින් 2025 මාර්තු 30 දින වන විට රු.1,113,522 ක් සමුපකාර අරමුදල වෙත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	කුරුණෑගල කොට්ඨාසයට අයත් විවිධ සේවා, පාසල් සමුපකාර කෘෂි සත්කාර්ය ස්වශක්ති හා වෙනත් සමුපකාර සමිති මඟින් එකතුව රු.24,252,187 ක් තවදුරටත් අයවීමට ඇති බව හා හලාවත කොට්ඨාශයේ සමුපකාර සමිති කලාප 12 ට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට වසරකට වැඩි හිඟ ශේෂය අයකරමින් පවතින බව.	1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 43(1) වගන්තිය හා 1973 සමුපකාර රීති 43(II) ප්‍රකාර කටයුතු කළ යුතුය.
(ඇ)	1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ IX වන වගන්තියේ 58 හා 59 වැනි උපවගන්ති සහ 1973 සමුපකාර සමිති රීති මාලාවෙහි අංක 49(V)(ඇ) සහ (ඈ) වගන්ති	ණය ආරවුල් බේරුම් කිරීමට පත්කළ බේරුම්කරුවකු, බේරුම් කිරීම ගැන වහාම ක්‍රියාකර විභාගයන් සම්පූර්ණ කර තමා පත් වී තුන්මසක් ඇතුළත තීන්දුව ලබා දීම සිදුකළ යුතු වුවද, ණය ආරවුල් බේරුම්කිරීම සඳහා 2025 මැයි 30 දින වන විටත්, බේරුම්කරුවන් 07 ක් වෙත භාරදී තිබූ වටිනාකම රු3,321,479 ක් වූ ණය ආරවුල්වලට අදාළ ලිපිගොනු 23 ක් හා බේරුම්කරුවන් කිහිප දෙනෙකු විසින් කටයුතු කළ වටිනාකම රු.5,714,764 ක් වූ ගොනු 05 ක් වෙනුවෙන් පත්කර මාස 02 සිට මාස 34 දක්වා කාලයක් ගතවී ඇතත් තීන්දු ලබාදී නොතිබුණි.	මෙම ආරවුල් සඳහා කාලය දීර්ඝකිරීම් ලබාගෙන විභාග කටයුතු සිදුකරමින් යනු ලැබේ. දෙපාර්ශවයේ කරුණු ඉදිරිපත් කිරීම් හා පාර්ශවකරුවන්ගේ ඉදිරි දින යොදාගැනීම් සම්බන්ධ ගැටලු නිසා කඩිනමින් ආරවුල් විසඳීම සිදු නොවන බව.	1973 සමුපකාර සමිති රීති මාලාවේ 49(v)(ඇ) වගන්තිය ප්‍රකාර කටයුතු කළ යුතුය.
(ඈ)	සමුපකාර සමිති රීති සඳහා සිදුකරන ලද සංශෝධිත	විගණන වාර්තාව සමිතියට භාරදුන් දින සිට මාස 06 ක් තුළ දායක මුදල් නොගෙවීම මත ඉක්ම වූ මාසයකට සියයට 01 බැගින් දඩ මුදලක් අයකළ යුතු වුවත් කුලියාපිටිය කලාපයට අදාළ	මින් ඉදිරියට සමුපකාර අරමුදල වෙන් කර මාස 06 ක් ගත වීමට පෙර සමුපකාර ප්‍රාදේශිය නිලධාරි මඟින් අය	සමුපකාර සමිති රීති සඳහා සිදු කරන ලද සංශෝධිත ගැසට් පත්‍රයේ 43(x)

ගැසට් පත්‍රයේ 43 (X) වගන්තිය	සමිති 19 ක් හා කුරුණෑගල කලාපයට අදාළ සමිති 19 ක පිළිවෙලින් රු.608,001 ක් හා රු.394,010 ක් ලෙස එකතුව රු.1,002,011 ක් 2024 ජූලි 30 දිනට දඩ වශයෙන් අයකළ යුතුව පැවතුණි.	කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව.	වගන්තිය ප්‍රකාර කටයුතු කළ යුතුය.

1.5.7.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	හලාවත සමුපකාර කොමසාරිස් කාර්යාලයට අදාළව අධිකරණ මඟින් අයකරන ලද දඩමුදල් වලින් ගෙවීම් සඳහා නිශ්චිතව හඳුනාගත නොහැකි නඩු 76 කට අදාළව රු.984,322ක් වටිනා ශේෂයන් පැවති අතර මෙම ශේෂය තුළ 2021 සිට 2024 දක්වා වූ වර්ෂයන්ට අදාළ ශේෂයන් ද පැවතුණි.	හඳුනානොගත් උසාවි දඩ හඳුනාගැනීම සඳහා තොරතුරු එවන ලෙස අදාළ උසාවි රෙජිස්ට්‍රාර්වරුන් වෙත දන්වා ඇති අතර, තහවුරු ලැබුණු පසු අදාළ නොවන බව තහවුරු වන මුදල් ආපසු උසාවි වෙත යැවීමට කටයුතු කරන බව.	උසාවි දඩ මුදල් අදාළ සමුපකාර සමිති හඳුනා ගෙන කඩිනමින් ලබාදිය යුතුය.
(ආ)	1983 අංක 32 සහ 1992 අංක 11 දරන සමුපකාර සමිති සංශෝධන පනත්වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 58 වගන්තිය ප්‍රකාරව 2023 වර්ෂයේ සිට පැවත එන ඉල්ලීම් 1931 ක්ද, ඇතුළුව ඉල්ලීම් 3704 ක් උසාවියේ බල ගැන්වීම සඳහා ලැබී තිබූ අතර වර්ෂය අවසන් වන විට තවදුරටත් උසාවි බලගැන්වී නොමැති තීරක ආරවුල් ඉල්ලීම් 1,866 ක් විය.	උසාවිගත කිරීම් සැලකිය යුතු ලෙස අඩුවීමක් දක්නට ඇත්තේ ඇතැම් උසාවිවලින් උසාවි බලගැන්වීම් බාර ගැනීම සීමා කර ඇති නිසා බව.	උසාවි බලගැන්වී නොමැති තීරක ආරවුල් ඉල්ලීම් කඩිනමින් උසාවි බලගැන්විය යුතුය.
(ඇ)	වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය විසින් සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත කඩිනමින් ණය සහන ලබාදීම වැඩ පිළිවෙල යටතේ චක්‍රීය ණය අරමුදලක් ලෙස ඉදිරියට ක්‍රියාත්මක නොකිරීමටත්, කොමසාරිස්වරු සතුව පවතින ණය මුදල් නැවත	පොදු තැන්පතු ගිණුමේ ඇති රු.මිලියන 08 ක මුදල ආහාර කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීම සඳහා කටයුතු කරනු ලබන අතර, මෙය චක්‍රීය ණයක් වශයෙන් ක්‍රියාත්මක වන බැවින් ආහාර කොමසාරිස් ලබා දෙන සෘජු උපදෙස් අනුව අතරමැදි සේවාවක්	පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන ඇති මුදල් ආහාර කොමසාරිස් වෙත භාර දිය යුතුය.

නිකුත් නොකිරීමටත්, අයකරගෙන තිබූ සියලු මුදල් නැවත ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට භාරදෙන ලෙස උපදෙස් ලබා දී තිබූ නමුත් 2024 ජනවාරි 29 වන දින දෙපාර්තමේන්තුව වෙත රු.මිලියන 08 ක මුදලක් ආහාර කොමසාරිස් වෙත භාරදීමකින් තොරව 2025 අප්‍රේල් 24 වන විට මාස 09 වැඩි කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.	පමණක් මෙම දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන බව.	

1.5.7.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂයේ ආරම්භයේ පැවති නොවිසඳන ලද තීරක ආරවුල් 590 ක් ද ප්‍රවර්තන වර්ෂය තුළ ලද තීරක ආරවුල් 2,694 ක් ද අතුලුව මුළු ආරවුල් 3,284 න් සමාලෝචිත වර්ෂයේදී ආරවුල් 2310 ක් පමණක් විසදා තිබුණි.	අතරැඳි ආරවුල් 940 න් 2025 මාර්තු 31 දින වන විට ප්‍රදානිත ගොනු 629 ක් කාර්යාලයට ලැබී ඇති අතර, ගොනු 227 ක ප්‍රමාණයක් තීරකවරුන් භාරයේ තීරක කටයුතු සිදු කරමින් පවතින බව හා ආරවුල් ගොනුවක් විසදීම සඳහා සමුපකාර රීති මාලාවේ 49 (V) (ඇ) වගන්තිය අනුව මාස තුනක කාලයක් ලබා දෙන අතර, ඒ අනුව රෙජිස්ටාර්වරයා විසින් තමාට වැටහෙන ප්‍රමාණයකින් කාලය දීර්ඝ කරනු ඇති බව.	නොවිසඳන ලද තීරක ආරවුල් සමුපකාර රීති මාලාවේ 49(v) (ඇ) වගන්ති ප්‍රකාර විසදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

1.5.7.4 දෘශ්‍ය අක්‍රමිකතා

	විගණන නිරීක්ෂණය	ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය මඟින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සඳහා ණය සහන ලබාදීමේ වැඩසටහන යටතේ පුත්තලම දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති	ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් මෙම සමුපකාර සමිති වෙත ලබාදිම සඳහා ණය මුදල් නිදහස්කර ඇත. වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මෙම	කුරුණෑගල, පුත්තලම දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති සමඟ අත්සන් කර තිබෙන ගිවිසුම් කොන්දේසි

	වෙත අදියර 04 යටතේ රු.මිලියන 82 ක්ද, කුරුණෑගල දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති වෙත අදියර 6 ක් යටතේ රු.මිලියන 69 ක්ද ලබාදී තිබුණ ද 2025 අප්‍රේල් මස අවසානය වන විට පුත්තලම හා කුරුණෑගල යන සමිති දෙකෙන් හිඟව පැවති මුදල පිළිවෙලින් රු.මිලියන 74 හා රු.මිලියන 69 ක් වශයෙන් එකතුව රු.මිලියන 143 ක මුදලක් විය.	කාර්යයේදී මැදිහත් කරුවෙකු ලෙස පමණක් කටයුතු කර ඇති බව.	ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	සමුපකාර සමිති සමඟ ඇතිකරගන්නා ලද ගිවිසුම් අනුව ණය මුදල ලබාදුන් දින සිට මාස 06 ක් ඉකුත් වීමට පෙර කල්පසු වූ ණය සඳහා මාසිකව සියයට 1.5 බැගින් ප්‍රමාද ගාස්තුවක් අය නොකිරීම මත 2023 වර්ෂයේ දෙසැම්බර් සිට 2024 වර්ෂය දක්වා කුරුණෑගල දිස්ත්‍රික් සමිතිය වෙත නිදහස් කළ රුපියල් මිලියන 25 ක ණය කල්පසුවීම මත අයකළ යුතු ප්‍රමාද ගාස්තුව වූ රු.4,920,000 ක මුදල හා පුත්තලම දිස්ත්‍රික් සමිතිය වෙත නිදහස් කර තිබූ රු.මිලියන 22 ක මුදල සඳහා රු.මිලියන 2,160,000 ක් ඇතුළව රු.7,080,000 ක ප්‍රමාද ගාස්තුව අයකිරීමට කටයුතු කර නොතිබුණි.	ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් මෙම සමුපකාර සමිති වෙත ලබාදිම සඳහා ණය මුදල් නිදහස්කර ඇත.වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මෙම කාර්යයේදී මැදිහත් කරුවෙකු ලෙස පමණක් කටයුතු කර ඇති බව.	කුරුණෑගල, පුත්තලම දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති සමඟ අත්සන් කර තිබෙන ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.5.8 ශීර්ෂය -222 ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

1.5.8.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දීර්සකාලින බදු පදනම මත පරිහරණය කිරීමට ඉල්ලුම්කරුවන් 198 දෙනෙකුට අදාළ හෙක්ටයාර් 852.15 ක් වූ ඉඩම් ප්‍රමාණයක්	දීර්ස කාලීන බදු අනුමැතිය සඳහා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති බව.	ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙතින් අනුමැතිය ලබාගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගතයුතු

නේවාසික, කෘෂිකාර්මික, වාණිජ, වෙනත් කටයුතු සහ රාජ්‍ය ආයතන අවශ්‍යතා සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ වයඹ පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශ සහිතව අනුමැතිය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර මාස 01 සිට වර්ෂ 08 දක්වා කාල පරාසයක් ගතව ඇතත්, 2024 නොවැම්බර් 18 දින වන විටත් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ලැබී නොතිබීම නිසා දීර්ඝකාලීන බදු ගිවිසුම් සකස් කිරීමට ප්‍රමාදවීම හා රජයට ලැබිය යුතු දීර්ඝකාලීන බදු නියමිත පරිදි අයකරගැනීමට නොහැකිවී තිබුණි.	වේ.

1.5.9 ශීර්ෂය 231 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

1.5.9.1 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	**අනුකූල නොවීම**	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 22.1 උපවගන්තිය	පුත්තලම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් රෝහල් වල, ප්‍රාථමික වෛද්‍ය සත්කාරක ඒකකවල හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල නිලධාරීන්ට අදාළව සිදුකරනු ලබන විනය පරීක්ෂණ වලදී අනුමැතියකින් තොරව අමතර කාලය ලබාගෙන තිබුණ ද, විනය පරීක්ෂණ වාර්තාව ලබා දීමට කටයුතු නොකළ අවස්ථා 08 ක් පැවතුණි.	පිළිතුරු ලබා දී නොමැත.	ආයතන සංග්‍රහය අනුව අමතර කාලය සඳහා අනුමැතිය ලබාගත යුතුය. විනය පරීක්ෂණ වාර්තා කඩිනමින් ලබාදිය යුතුය

1.5.9.2 කළමනාකරණ දූර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්කවල පවතින සෞඛ්‍ය ආයතනයන්හි කල් ඉකුත් වූ ඖෂධවල වටිනාකම රු.873,597 ක් හා ගුණාත්මක බවින් අසමත් ඖෂධවල වටිනාකම රු.268,624 ක් විය.	පිළිතුරු ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතින් කඩිනමින් ලබාගෙන ඉදිරිපත් කරන බව.	ඖෂධ කල් ඉකුත්වීමට පෙර අවශ්‍ය රෝහල් වෙත ලබාදීමට කටයුතු කළයුතු වීම හා කල් ඉකුත් වූ හා තත්ත්වයෙන් අසමත් ඖෂධ අපහරණයට කටයුතු කළ යුතුය.
(ආ)	ගල්ගමුව මූලික රෝහලේ පල්දෝරු පද්ධතිය සේවා කිරීම සඳහා යම් නිශ්චිත ආයතනයක් සමඟ සමාලෝචිත වර්ෂයේ ගිවිසුම්ගත නොවීම මත නියමිත කාලය තුළ සේවා කිරීම ඉටු කරගැනීමට නොහැකිවීම මෙන්ම සමාලෝචිත වර්ෂයේදී රු.10,374,560 ක වියදමක් දරා අලුත්වැඩියා කටයුතු කිරීමට ද සිදුවී තිබුණි.	පිළිතුරු ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතින් ලැබී නොමැති බව.	සේවා ගිවිසුම් සඳහා එළඹිය යුතුය.
(ඇ)	කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන දෙකක් අනතුරට ලක්වී පිළිවෙලින් වසර 3 ½ ක් හා වසර 02 මාස 03 ක් ගතවී තිබුණද මූලික පරීක්ෂණ අවසන් වී විනය පරීක්ෂණ අවසන් වී නොතිබීමෙන් එකතුව රු.18,334,550 ක අලාභ අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර නොතිබුණි.	<u>LW - 1790 ගිලන්රථය</u> මෙම ගිලන් රථය සඳහා වූ අලාභය වන රු. 11,705,970.15ක මුදල (දෙපාර්තමේන්තු ගාස්තු සියයට 25 සමඟ) එහි රියදුරු වන සී.ඩී.එම්.ජේ.විජේබණ්ඩාර යන අය විසින් නොගෙවීම නිසා එම මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. රිදීගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අයත් අංක PE – 4736 දරන කැබ් රථයේ රියදුරු මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩුවෙන් නිදොස් කොට නිදහස් කර ඇති බව.	විනය පරීක්ෂණ කඩිනමින් අවසන් කිරීමට හා අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

5.10 ශීර්ෂය 232 - වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

1.5.10.1 කළමනාකරණ දුර්වලතා

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 මාර්තු 05 දිනැති සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක 2024/06-01 දරන චක්‍රලේඛය අනුව ජපන් රජයේ ප්‍රදාන යටතේ ආයුර්වේද දෙපාර්තමේන්තුවට වාහන හා ජෙනරේටර් සඳහා මාසිකව ඉන්ධන ලීටර් 1,630 ක් වශයෙන් වාර්ෂිකව ලීටර් 19,560 ක් ලබා ගත හැකිව තිබියදීත් 2024 වර්ෂයේදී එම ප්‍රදානය යටතේ ලීටර් 7,803 ක් පමණක් ලබාගෙන දෙපාර්තමේන්තු වැය විෂයය මගින් රු.1,651,650ක් ඉන්ධන සඳහා වැයකර තිබුණි.	දෙපාර්තමේන්තුවට අයත් වාහන 07 ක් සඳහා දෛනිකව ඉන්ධන නිකුත් කිරිම සිදු කරයි. KC –1789 කාර් රථය සඳහා අවශ්‍ය පෙට්‍රල් මෙම ක්‍රමය යටතේ නිකුත් නොකරන අතර එය සාමාන්‍ය ඉන්ධන නිකුත් කිරිමක් ලෙස සිදු කරන බව.	චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුය.

1.5.11 ශීර්ෂය 233 - වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව

1.5.11.1 නීති,රීති රෙගුලාසි වලට අනුකූල නොවීම

නීති,රීති රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.7 වගන්තිය	වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත ගණකාධිකාරි තනතුරක් නොතිබියදී ගණකාධිකාරීවරයෙකුට රාජකාරි ආවරණය කිරීම වෙනුවෙන් 2013 අප්‍රේල් සිට 2024 දෙසැම්බර් දක්වා කාලය තුළ රු.1,392,982 ක මුදලක් රාජකාරි ආවරණ දීමනා ගෙවා තිබුණි.	වයඹ ප්‍රධාන ලේකම්ගේ හා වයඹ ආණ්ඩුකාර ලේකම්ගේ අනුමැතිය පරිදි රාජකාරි ආවරණ දීමනා ගෙවීම් කර ඇති බව.	ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතු වේ.

1.5.11.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වැවෝදාගම වැඩිහිටි නිවාසයේ සෞඛ්‍ය අරමුදල් ගිණුම සඳහා 2010 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වාර 07 කදී රු.1,100,000 ක මුදලක් ලබා දී තිබුණු අතර එම මුදල් සෞඛ්‍ය අරමුදලේ අරමුණ වන නේවාසිකයන්ගේ සෞඛ්‍ය පහසුකම් පවත්වා ගැනීමට යොදා නොගෙන රු.1,063,160 ක මුදලක් වසර ගණනක් ගිණුමේ නිෂ්කාර්යව තබාගෙන තිබුණි.	වැවෝදාගම වැඩිහිටි නිවාසයේ සෞඛ්‍ය අරමුදල් නේවාසිකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය යහපත්ව පවත්වා ගැනිම සඳහා යොදා ගැනීමට උපදෙස් ලබා දෙන ලද බව.	සෞඛ්‍ය අරමුදලේ අරමුණ ඉටු කරගැනීමට මුදල් යෙදවිය යුතුය.

1.5.12. ශීර්ෂය -234 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

1.5.12.1 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.7 වගන්තිය ප්‍රකාරව	වයඹ පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ අනුමත ගණකාධිකාරි තනතුරක් නොමැති වුවද, එම තනතුරේ රාජකාරි ආවරණය කිරීම වෙනුවෙන් 2019 ජූලි 15 සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ රාජකාරි ආවරණ දීමනා ලෙස රු.761,520 ක් ගෙවා තිබුණි.	ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි මෙම තනතුර පුරප්පාඩු වූ තනතුරක් නොවන අතර, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යටතේ ගණකාධිකාරී තනතුරේ රාජකාරී ආවරණය සඳහා සිදු කළ පත්කිරීමකි. එම අනුමැතිය ලබා දීමේදී, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III වන පන්තියේ ආරම්භක වැටුපෙන් ¼ ක් වන සේ දීමනාවක් ගෙවීමටද ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින් ඒ අනුව ගෙවීම් කර ඇති බව.	ආයතන සංග්‍රහය පරිදි කටයුතු කළ යුතුය.

1.5.12.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
විදේශ අමාත්‍යාංශයේ කුරුණෑගල ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලය පිහිටුවීම සඳහා පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ තුන්වන මහලේ කොටසක් 2021 ජූලි 27 දින සිට ලබා දීමට ගිවිසුම් ගත වී තිබූ නමුත් කුලී ගාස්තුවක් අයකිරීම සම්බන්ධයෙන් කොන්දේසියක් ඇතුළත් කර නොතිබීමෙන් වසර 04 ක කාලයක් කිසිදු බිම් කුලි ගාස්තුවක් අයවී නොතිබුණ අතර, 2024 වර්ෂ ආරම්භයේ සිට වසර 03 කට රු.60,000 කට මාසික කුලිය තක්සේරු කර තිබුණ ද, 2025 ජූලි 30 දක්වා ද ගිවිසුම්ගතව නොතිබුණි.	2025 මාර්තු 03 දින ගිවිසුම් ගත වීම සඳහා දෙවන පාර්ශවය වෙත යොමු කර ඇති බව.	තක්සේරු කර බිම් කුලියක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.12.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.4,866,842 ක වියදමින් මීගලෑව අම්ල සෙවන ළමා නිවාස පරිශ්‍රයේ ඉදිකල අවිවාහක ගර්භණී මව්වරුන් සඳහා වූ රැකවරණ මධ්‍යස්ථානය කාර්යමණ්ඩල හිඟය හේතුවෙන් කටයුතු ආරම්භ කළ නොහැකිව නිශ්කාර්යව පැවතුණි.	ඉදිරියේදී කාර්යය මණ්ඩලය බඳවා ගැනීමෙන් පසුව ළමා මවුවරුන් රැඳවීමට අපේක්ෂා කරන බව.	රැකවණ මධ්‍යස්ථානය ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය.

1.5.13. ශීර්ෂය 241 - පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව

1.5.13.1 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 (2) වන රෙගුලාසිය	දෙපාර්තමේන්තුවේ තැන්පත් කළ දින සිට වර්ෂ 02 ඉක්ම වූ රු.6,248,991 ක් වටිනා ඉකුත් තැන්පතු 15 ක් නිරවුල් කිරීමට හෝ රාජ්‍ය ආදායමට බැරකිරීමට කටයුතු කර නොතිබුණි.	ව්‍යාපෘති 07 කට අදාළව ගිවිසුම් කාලය අවසන් නොවීමෙන් මුදල් නිදහස් කළ නොහැකි වී ඇත. ඉතිරි තැන්පතු කඩිනමින් නිදහස් කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය.

1.5.13.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුත්තලම කර්මාන්තපුර අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඝන මීටර් 2,807 ක් පමණ වූ ABC හා 6" x 9" ගල් ෆයිල් කිරීම ශ්‍රමිකයින් විසින් සිදුකිරීම ප්‍රායෝගික හා ආර්ථික නොවන අතර, ඒ සඳහා යන්ත්‍ර භාවිතයෙන් ඉතා අඩු මුදලකට කළ හැකි වුවද, එලෙස ඇස්තමේන්තු සකස් නොකර කම්කරු ශ්‍රමයෙන් සිදුකිරීමට ඇස්තමේන්තු සැකසීමට කටයුතු කර, අදාළ කාර්යය සඳහා රු.1,072,400 ක ගෙවීමක් කරතිබුණි. එසේම එකී ද්‍රව්‍ය සැපයීම නියමිත ප්‍රමාණයෙන් සපයා ඇති බවද විධිමත්ව තහවුරුකර නොතිබුණි.	වර්තමානයේ පවතින මිල විග්‍රහයට අනුව ගොනු කිරීම සඳහා කම්කරුවන් භාවිතය සඳහා පමණක් මිල සපයා ඇති අතර, යන්ත්‍ර භාවිතයෙන් ගොනු කිරීම සඳහා මිලක් සපයා නොතිබීම තුළින් ඇස්තමේන්තු කිරීමේදී එලෙස යන්ත්‍ර මඟින් ගොනු කිරීමට මිලක් යෙදීමට නොහැකි බව.	රේට සාදා භාවිතයට ගැනීම ආයතනයේ වගකීමක් වන අතර අලාභ අවම වන ආකාරයෙන් කටයුතු කළ යුතුය.

(ආ) වෙන්නප්පුව කම්මල මාර්ගයේ පෙට්ටි බෝක්කුව ඉදිකිරීම් ව්‍යාපෘතියෙහි ඉදිකිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු.

(i)	කාර්යාලය සඳහා මසකට රු.15,000 බැගින් මාස 05 කට රු.75,000 ක් ගෙවල් හිමියාට ගෙවා තිබියදී ඒ වෙනුවෙන්ම ඇස්තමේන්තු අංක 1.09 යටතේ රු.375,000 ක් වැය කළ හැකි පරිදි අධි ඇස්තමේන්තුකර රු.300,000 ක් වැඩිපුර ගෙවීම්කර තිබුණි.	මෙම ව්‍යාපෘතියේ වැඩබිම් කාර්යාලය හා ගබඩාව සඳහා යොදාගන්නා ලද ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී 2024 වර්ෂය සඳහා අනුමත රේට් මිල ගණන් භාවිතා කර ඇති බව.	ඇස්තමේන්තු සකස්කිරීමේදී හැකිතාක් නිවැරදිව සකස් කළ යුතුය. ඇස්තමේන්තු කළ වැඩවලට අමතරව කාර්යයන් ඉටුකර ඇත්නම් ඒ සම්බන්ධ තොරතුරු පවත්වාගෙන යා යුතුය.
(ii)	ව්‍යාපෘතියෙහි පස්, බොරළු, ABC හා වැලි ඝනමීටර් 2127 ක් සත්‍ය වශයෙන් යෙදවූ බවට විධිමත්ව සහතික කළ ගොනු මිනුම් වාර්තා නොමැතිව කොන්ත්‍රාත්කරු වෙත රු.7,549,793 ක් ගෙවා තිබුණි.	ව්‍යාපෘතිය ආරම්භයේ යොදා ගන්නා ලද බොරළු ඝනමීටර් 803 ක් වාහන ධාරිතාවය පදනම් කරගෙන මිනුම් ලබාගෙන ඇත.බොරළු හා ABC ගොනුගත කර පරීක්ෂා කර බලා අවසර ලබාදී ඇත. ද්‍රව්‍ය ගොනුගත කර මූලස්ථාන ඉංජිනේරු පරීක්ෂාවෙන් පසු ඇතිරීමට ලිඛිත අනුමැතිය ලැබෙන තුරු ව්‍යාපෘතියේ සීමිත කාලරාමුව තුළ වැඩ අවසන් කිරීමට ඇති බැවින් ප්‍රමාද නොවී අවසර ලබාගෙන කටයුතු කරන අවස්ථාද පවතින බව.	පූර්ණ හා සමීප අධීක්ෂණයකින් සහ නිශ්චිත සහතික කිරීමකින් පසුව ගෙවීම් කළ යුතුය.
(iii)	කර්මාන්තයේ කටයුතු අධීක්ෂණය සඳහා කාර්මික නිලධාරී හෝ දෙපාර්තමේන්තුව වෙනුවෙන් වැඩ බලන වෙනත් සමීප අධීක්ෂකවරයකු පූර්ණකාලීනව අධීක්ෂණය නොකර කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද දෛනික කම්කරු ලේඛන/ චෙක්රෝල් පදනම්කර යන්ත්‍ර හා ශ්‍රමය වෙනුවෙන් රු.6,036,860 ක් ගෙවීම් කර තිබුණි.	කාර්මික නිලධාරින්ගේ හිඟය මත කාර්මික නිලධාරියෙකුට එක් වැඩ බිමක පූර්ණ කාලීනව රැඳී සිටීමට හැකියාවක් නොමැති අතර, ගෙවීම් කටයුතු සිදු කරනුයේ දින ගණන් පදනමෙන් වන අතර ඒවායේ අධීක්ෂණ කටයුතු දිනය තුළ වරින්වර සිදු කරන බවත්, කාලය තහවුරු කර ගැනීම සඳහා අදාළ යන්ත්‍රයේ සැපයුම්කරු හා යන්ත්‍රයේ ක්‍රියාකරුවන් හැර ශ්‍රමිකයන්ගෙන් ද තොරතුරු ලබාගන්නා බව.	ඍජු කම්කරු ක්‍රමයේදී සැපයුම්කරුවන්ගේ අත්සන් ලේඛන මත පදනම්ව ගෙවීම් නොකර විධායක ඉංජිනේරු කාර්යාලද අත්සන් ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.

(iv)	ව්‍යාපෘතියෙහි මඩ/පස්වැටියක් (Coffer dam) ඉදිකරන බවට රු.1,179,545 ක මුදලක් ඇස්තමේන්තු කර අදාළ කාර්යය සිදුනොකර එම ස්ථානයෙන් ඉවත්කළ පස් මඟින් පැවති බෝක්කු කටවල් අවහිර කොට අදාළ කාර්යය ඉටුකළ බවට ව්‍යාජ බිල්පත් ඉදිරිපත් කර ඉටුකර නොමැති වැඩ සඳහා රු.958,920 ක් ගෙවා තිබුණි.	මෙම පස් වැටිය ඉදිකිරීම සඳහා පස් ඝණ මීටර් 717.60 ක් පමණ වන බවට ගණන් බලා ඇති අතර එහිදී බෝක්කු කොටස (Cell) කැනීමේ දී ජනනය වන පස් මඩ වැටිය ඉදිකිරීම සඳහා භාවිතා කිරීමට ඇස්තමේන්තු කරන අවධියේම ගණන් බලා ඇති බවත් ඒ සඳහා අවශ්‍ය ඉතිරි පස් ඝණ මීටර් 274 ක් පිටතින් සපයාගත් බව.	ඍජු ශ්‍රම කර්මාන්ත සඳහා සමීප අධීක්ෂණයක් පවත්වාගෙන යා යුතු අතර නොකළ වැඩ සඳහා ගෙවීම් නොකිරීමට වගබලා ගතයුතුය.
(v)	ව්‍යාපෘතියෙහි ඉදිකිරීමේදි පැය 1000 ක් ජලය ඉවත්කිරීම සඳහා අයිතම අංක 2.09 යටතේ රු.1,500,000 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර පැය 653 ක් ජලය ඉවත්කළ බව දක්වමින් රු.712,200 ක් ගෙවීම් කර තිබුණි. එම ගෙවීම සඳහා වතුර මෝටර් යෙදවීම අසාමාන්‍ය වන අතර කාර්මික නිලධාරී ඉදිරිපත් කළ විස්තර හා ඡායාරූප අනුව එපමණ වතුර මෝටර් ප්‍රමාණයක් සහ කාලයක් යොදවා නොමැති බව තහවුරු වන අතර ව්‍යාජ හා අසාමාන්‍ය බිල් ඉදිරිපත් කර ගෙවීම් කර තිබුණි.	එක් වතුර මෝටරයක් පමණක් යොදාගත්තේ නම් වම් පස coffer dam එක අසලින් ඉවත් කරන විට දකුණු පසින් කාන්දු වන ජලය ඉවත් කිරීමට අවස්ථාවක් නොමැති වීම මත දකුණු පසින් එන වතුර කොන්ක්‍රීට් මතින් ගලා ගොස් වම් පස යොදා ඇති මෝටරය වෙත ළඟා වීමක් සිදු වන බැවින් ප්‍රායෝගිකව වතුර මෝටර් දෙකක් යොදාගත් බව.	ඇස්තමේන්තු සැකසීමේදී හැකිතාක් තාත්ත්විකව සකස් කළ යුතු අතර ව්‍යාජ ගෙවීම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.
(vi)	ව්‍යාපෘතියෙහි අමතර පිවිසුම් මාර්ගය හා ජලය ගලාඒම වැළැක්වීම සඳහා පස්වැටිය සකස් කිරීමට පස් සනමීටර් 2383 ක් යොදවා තිබූ අතර, පාලම ඉදිකිරීමෙන් පසු භාවිතයට ගත නොහැකි මුළු පස් ප්‍රමාණය සනමීටර් 465 කට ආසන්න ප්‍රමාණයක් විය. ඒ අනුව කාර්යය ආරම්භයේ යෙදවුම් හා අවසානයේ ඉවත්කිරීම් ප්‍රමාණය අතර, පස් සනමීටර් 1918 ක පමණ	වැඩිපුර ප්‍රමාණයක් ගණනය වන්නේ WING WALL ඉදිකිරීමේදී ඉවත්කරන පස් ප්‍රමාණයක් ඒහි දැමීම හේතුවෙන් බව.	ව්‍යාපෘති සම්බන්ධයෙන් මනා අධීක්ෂණයක් පවත්වාගෙන යා යුතු අතර රජයට වාසිදායක වන ආකාරයට කටයුතු කළ යුතුය.

	අඩුවක් පෙන්නුම් කෙරුණි.		
(vii)	උක්ත ඉදිකිරීම අවසානයේ බැහැරට ගෙනගොස් ඇති පස් ප්‍රමාණය ඝනමීටර් 120 ක් වන අතර එම ප්‍රමාණය වැඩබිමේ සිට කිලෝමීටර් 05 ක් ප්‍රවාහනය කිරීම සඳහා දින 02 ක් තුළ ලොරි රථ 03 බැගින් ලොරි රථ 06 ක් යොදාගත් බව දක්වමින් ලොරි රථයකට රු.40,000 බැගින් පස් කියුබ් 01 ක් කිලෝමීටර් 05 ක් ප්‍රවාහනයට රු.5,664 බැගින් අසාමාන්‍ය මුදලක් ගෙවා තිබූ අතර එම පස් ප්‍රවාහනයේදී රු.150,858 ක් ව්‍යාජව වැඩිපුර ගෙවා තිබුණි.	ඉවත්කරන ලද බොරළු වලින් සුදුසු බොරළු ලොරි රථ යොදා ගනිමින් ක්ෂේත්‍රයට ආසන්නතම ස්ථානයකට ප්‍රවාහනය කළ අතර, ඊට අදාළ අනුමත මිල ගණන් යටතේ ගෙවීම් සිදුකළ බව.	ව්‍යාපෘති සම්බන්ධ මනා අධීක්ෂණයක් සිදුකළ යුතු අතර, ව්‍යාජ ගෙවීම් අවම කරගැනීමට කටයුතු කළ යුතුය.

1.5.13.3 කාර්ය මණ්ඩල පරිපාලනය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ජ්‍යෙෂ්ඨ මට්ටමේ ඉංජිනේරු තනතුරෙහි අනුමත තනතුරු 07 න් තනතුරු 04 ක්, තෘතියික මට්ටමේ තාක්ෂණික නිලධාරී තනතුරු 04 ක හා ද්විතීයික මට්ටමේ තාක්ෂණික නිලධාරී තනතුරු 45 න් 18 ක පුරප්පාඩු පවතින අතර, ඉදිකිරීම් කටයුතු සඳහා අත්‍යාවශ්‍යම නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතීම මත ඉදිකිරීම් කටයුතු නිසි අධීක්ෂණයකින් යුත්කව කරගෙන යාමේ ගැටළු ඇතිවී තිබුණි.	කාර්මික තනතුරු 45 කට අදාළ වූ රාජකාරි කටයුතු 28 වූ තත්‍ය කාර්ය මණ්ඩලයෙන් ද විධිමත්ව කළමනාකරණය කර ගැනීමේ දී අපහසුතා ඇති වීම නොවැළැක්විය හැකි බව.	ඉංජිනේරුවරුන්ගේ කාර්මික නිලධාරීන්ගේ හිඟය ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට ගැටලුවක් බැවින් අනුමැතීන් ලබාගෙන බඳවාගැනීමට කටයුතු කළ යුතුය.

1.5.14 ශීර්ෂය 243 - වයඹ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

1.5.14.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බෝයගනේ පේෂකර්ම තොග මධ්‍යස්ථානයේ රු.2,263,980 ක භාණ්ඩ හා මුදල් ඌනතාවය සම්බන්ධ අවසන් වාර්තාව ඉදිරිපත් කර මාස 03 ක කාලයක් ගතව ඇතත් විනය ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.	මෙම අක්‍රමිකතාවය පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් ගතයුතු හා ගතහැකි විනය ක්‍රියාමාර්ග හා නීතිමය ක්‍රියාමාර්ග කල් පමාවකින් තොරව අවශ්‍ය පියවර ගෙන ඇති බව හා මූලික විමර්ශණයේ වාර්තාව ලද පසු ඉදිරි කටයුතු සිදු කරන බව.	විනය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය.

1.5.15. ශීර්ෂය 250 - වයඹ පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා

1.5.15.1 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2022 ජූලි මස 18 දින සිට ඩෙනවර්වත්ත ඉඩමෙන් අක්කර 91 ක ප්‍රමාණය වසර 30 ක කාලයක් සඳහා නාවික හමුදා මූලස්ථානය වෙත පරිහරණ අයිතිය අවබෝධතා ගිවිසුමක් මඟින් ලබාදී තිබුණි. නමුත් ඉඩම් කොමසාරිස් කාර්යාලය විසින් රජයේ ඉඩම් රාජ්‍ය ආයතන සඳහා පරිහරණ අයිතිය පමණක් ලබාදෙන අතර, එය අපේක්ෂිත කාර්යයට යොදා නොගෙන නැවත වෙනත් ආයතනයකට පැවරීම් කර තිබූ අතර එකී පැවරීමෙන් නීතිමය ප්‍රතිපාදනයන් අනාවරණය කරගැනීමට නොහැකිවීම මත මෙම අවබෝධතා ගිවිසුමේ නීත්‍යානුකූල බව පිළිබඳ විගණනයේදී ගැටලුකාරී විය.	නාවික හමුදාව වෙත වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි 2022 ජූලි 19 දින සිට අක්කර 88 රූඩ් 02 පර්චස් 16 ක ඉඩම් ප්‍රමාණයක් වසර 30 ක කාලයක් සඳහා පරිහරණ අයිතියට ලබාදීමට පමණක් ගිවිසුම්ගතව ඇති බව.	අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලබන ඉඩම්, අමාත්‍යාංශය විසින්ම ඵලදායීත්වය නැංවීමට කටයුතු කිරීම වඩාත් යෝග්‍ය වේ.

1.5.15.2 කාර්යසාධනය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ඩෙනවර්වත්ත පටක රෝපණ විද්‍යාගාරයේ මාසිකව පැල 2500 ක් නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වන බවට සැලසුම් කර තිබූ නමුත්, 2024 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා එක් මාසයකදී උපරිම වශයෙන් නිෂ්පාදනය කර තිබූ පැල සංඛ්‍යාව 500 කි. සමාලෝචිත වර්ෂය තුළ නිපදවූ මුළු කෙසෙල් පැල ගණන 4659 කි. ඒ අනුව 2024 වර්ෂය වන විට පටක රෝපණ විද්‍යාගාරය තුළින් අපේක්ෂිත ඉලක්ක සපුරාගෙන නොතිබුණි.	2024 වර්ෂය තුළ අපේක්ෂිත ඉලක්කය පැල 10000 වූ අතර, ආසාදන තත්ත්ව හේතුවෙන් ඉලක්කගත පැල නිෂ්පාදනයට ළඟා වීමට නොහැකිවිය.	ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.15.3 වාහන උපයෝජනය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අමාත්‍යාංශයේ නිල වාහනයක් 2014 දෙසැම්බර් 30 දින අනතුරකට භාජනයවී තිබූ අතර, රු.6,019,533 ක අලාභයක් සිදුවී තිබුණි. එයින් රු.3,960,000 ක මුදලක් රක්ෂණ සමාගම මඟින් ප්‍රතිපූර්ණය කර තිබුණු අතර, පරීක්ෂණය අනුව ඉතිරි රු.2,059,533 ක මුදල අදාළ වගකිවයුතු පාර්ශවයන්ගෙන් 2024 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.	වාහනයේ 2014 දෙසැම්බර් 30 දින සිට සිදුවූ අනතුරට අදාළව රක්ෂණ වන්දි ලෙස රු.3,960,000 ක මුදලක් ලැබීමෙන් පසු හිඟව පැවති රු 2,059,533ක මුදල රියදුරුගෙන් අයකර ගැනීමට හලාවත දිසා අධිකරණයේ නඩු පවරා ඇති අතර නඩුව විභාග වෙමින් පවතී.	අනතුරට ලක් වූ වාහනයක් සම්බන්ධව ඉතා කඩිනමින් පරීක්ෂණ පවත්වා අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.15.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේ කෘෂි චක්‍රීය ණය අරමුදලෙන් ප්‍රතිලාභීන් 1319 දෙනෙකු සඳහා රු.325,235,000 ක මුදලක් නිකුත් කිරීමට අමාත්‍යාංශ අනුමැතිය ලබාදී තිබුණ ද, ප්‍රතිලාභීන් 418 දෙනෙකු වෙනුවෙන් පමණක් රු.80,475,000 ක ණය නිකුත් කර තිබුණි. ඒ අනුව ප්‍රතිලාභීන් 901 දෙනෙකුට හෙවත් අනුමත ප්‍රතිලාභීන්ගෙන් සියයට 69 ක ප්‍රමාණයකට මේ වන විටත් බැංකුව විසින් ණය නිකුත් කර නොතිබුණි.	ණය ලබාදීම කඩිනම් කිරීම සඳහා බැංකු නිලධාරීන් සමඟ කෘෂි ප්‍රවර්ධන නිලධාරීන් සාකච්ඡා කර ප්‍රතිලාභීන් තෝරාගැනීම වර්තමානයේදී සිදුකරනු ලැබේ.	ණය අරමුදලේ අපේක්ෂිත අරමුණු ලඟා කර ගැනීමට බැංකුව සමඟ එක්ව කටයුතු කළ යුතුය.
(ආ)	කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් මාවතගම පශු සම්පත් සමුපකාර සමිතියට ලබාදුන් රු.359,655 ක්ද, දඹදෙණි සංවර්ධන පදනමට ලබාදුන් රු.431,789 ක්, කෘෂි ව්‍යවසායක සංවර්ධන පදනමට ලබාදුන් රු.550,000 ක් වශයෙන් ලබාදී ඇති මුළු ණය මුදල වන රු.1,341,414 ක් 2024 දෙසැම්බර් 31 දින වන විට ආපසු අමාත්‍යාංශය වෙත ලැබියයුතුව තිබුණි.	මාවතගම පශු සම්පත් සංවර්ධන සමුපකාර සමිතිය ක්‍රියාත්මක නොවන බැවින් ඈවර කිරීමෙන් අනතුරුව ණය මුදල ගෙවීමට කටයුතු කරනු ලබන බව. දඹදෙණි සංවර්ධන පදනම වෙතින් ලබාදුන් ණය පිළිබඳ ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් තොරතුරු රැස් කර ඉදිරියේදී සාකච්ඡා කිරීමට නියමිත බව.	හිඟ ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.15.5 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2014 ජනවාරි 28 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ අංක 01/2014 හි 1.1.1 (C) හා (D) වගන්ති වලට අනුකූල නොවන පරිදි පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්වරයා 2022 ජූනි මස සිට	චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි ගෙවා ඇති රු.65000 ක මුදල ඉදිරියේදී මෙම අධිකාරිය වෙත අයකර ගැනීමට කටයුතු කරන බව	චක්‍රලේඛනයට පටහැනිව ගෙවීම් කර ඇති මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

2023 ජූලි මාසය දක්වා වයඹ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය හා වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරියේ සභාපති ලෙස කටයුතු කරමින් රු.10,000 බැගින් අධිකාරී 02 ක සඳහා දීමනා ලබාගෙන තිබුණි. ඒ අනුව වැඩිපුර ගෙවීම් ලෙස රු.5000 බැගින් මාස 13 ක් සඳහා රු.65,000 ක් චක්‍රලේඛනයටද අනුකූල නොවන පරිදි දීමනා ලබාගෙන තිබුණි

1.5.16 ශීර්ෂය 251 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

1.5.16.1 නිශ්කාර්ය/ ඌන උපයෝජන වත්කම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිශ්කාර්යව පවතින නිල නිවාස 29 න් 09 ක් අලුත්වැඩියා කළහැකි තත්ත්වයේ පැවති අතර, නිවාස 02 ක අනවසර පදිංචිකරුවන් විය. මෙම නිවාස අලුත්වැඩියාවට හා අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට වගකිවයුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 09 ක් අලුත් වැඩියා කටයුතු සිදු නොකිරීමට හේතු වී ඇත්තේ එම නිල නිවාස පිහිටි ඉඩම් වල අයිතිය මෙම දෙපාර්තමේන්තුවට නොමැති බැවින් සහ ඉල්ලුම්කරුවන් නොසිටීම යන කරුණු මත වන අතර, මෙම ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බව.	අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත් කර රජයේ නිවාස ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුය.

1.5.16.2 ආර්ථික නොවූ ගණුදෙනු

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සිදු නොකිරීම හේතුකොටගෙන Huller යන්ත්‍ර 112 ක් මිලදීගැනීමට වැයකළ රු. 48,977,600 ක වියදම වර්තමානය වන විට නිශ්කාර්ය	රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය කරුණු හේතුවෙන් කාබනික පොහොර භාවිතයට කටයුතු කළ නිසා මෙම යන්ත්‍ර එම වකවානුවේ මෙම ප්‍රතිලාභීන්ට ලබාදී ඇත.	විශාල පිරිවැයක් දරමින් යන්ත්‍ර උපකරණ මිලදීගැනීමේදී නිසි ශක්‍යතා අධ්‍යයනයකින් යුතුව මිලදීගැනීමට කටයුතු කළ

වියදමක් වී තිබුණි.	නැවත කාබනික පොහොර වෙනුවට රසායනික පොහොර භාවිතය නිසා කාබනික පොහොර නිෂ්පාදනය අඩුවීම හේතුවෙන් නිශ්කාර්යව පවතින බව.	යුතුය.

1.5.16.3 ප්‍රසම්පාදනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වයඹ පළාත තුළ වස විස නැති ගොවි වෙළඳපල ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් රු.15,930,000 කට සියයට 50 ක් රජයේ දායකත්වය යටතේ මිලදී ගත් සූර්ය බල වියලන යන්ත්‍ර 50 ක් වයඹ පළාත තුළ හඳුනාගත් ප්‍රතිලාභීන් වෙත ලබාදීම යටතේ, කුරුණෑගල වැව්ලි සමාගමට යන්ත්‍ර 06 ලබාදී තිබූ අතර, ඉන් යන්ත්‍ර 03 ක් දොඩම්ගස්ලන්ද ගොවිපලේ අනාරක්ෂිතව නිශ්කාර්යව පැවතුණි. යන්ත්‍ර මිලදී ගැනීමේ දී යන්ත්‍ර ක්‍රියාකරවීමට අදාළව ප්‍රතිලාභීන් පුහුණු කිරීම, යන්ත්‍ර කාලීනව සේවා කිරීම සහ නඩත්තුව, අලුත්වැඩියාවන් සිදුකිරීමට අවශ්‍ය දැනුම සැපයුම්කරුගෙන් ලබාගැනීමටත් එසේම අමතර කොටස් ලබාගැනීම සම්බන්ධව අවධානයක් යොමුකර නොතිබීම හේතුවෙන් යන්ත්‍ර 06 ක් නිශ්කාර්යව පැවතුණි.	වැව්ලි සමාගමේ ව්‍යවසායකයන් සඳහා මෙම සූර්ය වියලන යන්ත්‍ර ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින්, මෙම යන්ත්‍ර නිශ්කාර්යව තබා ගැනීමට වඩා ඵලදායී නිෂ්පාදන කාර්යයන් සඳහා යෙදවීමට ප්‍රතිලාභී ව්‍යවසායකයින්ගෙන් සියයට 50 ක දායකත්වය මත යන්ත්‍ර ලබාදුන් බව. පිරිවිතර සකස් කිරීමේදී ද, ලංසු නිවේදන සකස් කිරීමේදී ද, තාක්ෂණික කමිටුව විසින් ලංසු ඇගයීමේදී ද යන්ත්‍ර නඩත්තුව, සේවා කිරීම, අමතර කොටස් ලබා ගැනීම පිළිබඳව අදාළ ලේඛනවල සඳහන් වී ඇති බවත්, තාක්ෂණික ඇගයීම් කමිටුව ඒ පිළිබඳව අවධානය යොමුකර ඇති බවත් ලේඛණ පරීක්ෂා කිරීමේදී පැහැදිලි වේ. එසේම මෙම යන්ත්‍ර පිළිබඳ පුහුණුව 2024 නොවැම්බර් 05 දින සිදුකර ඇති බව.	ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන ආකාරයට, මිලදීගත් යන්ත්‍ර බෙදාහැරීම කළ යුතුය. තවද නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව මිලදී ගැනීම නොකළ යුතුය.
(ආ)	කාබනික පොහොර නිෂ්පාදන ව්‍යවසායකයින් බිහිකිරීම - 2021 ව්‍යාපෘතිය යටතේ වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පුද්ගලික ආයතනයකින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලැබූ SRW 08 මාදිලියේ Multi Chopper Diesel යන්ත්‍ර එකක් රු.395,000 බැගින් යන්ත්‍ර 107 ක් මිලදීගැනීමට	මෙම යන්ත්‍ර පණගැන්වීම අපහසු බව සඳහන් කර ඇති නමුත්, මිලදී ගැනීම සඳහා ලබාදී තිබූ සාම්පලය ක්‍රියාත්මක කර බැලූ අතර එම යන්ත්‍රය අපහසුතාවයකින් තොරවම ක්‍රියාත්මක විය. ඒ අනුව මෙම යන්ත්‍ර මිලදී ගැනීම සිදුකරන ලද බව.	මිලදීගන්නා යන්ත්‍රවල එක් සාම්පලයකට අමතරව වැඩි යන්ත්‍ර ප්‍රමාණයක් පරීක්ෂා කර බලා මිලදීගැනීමට කටයුතු කිරීම හා හානිපූර්ණය කරගත හැකි වගන්ති ගිවිසුමට ඇතුළත් කර මිලදීගැනීමට කටයුතු කළ යුතුය.

රු.31,698,750 ක සියයට 75 ක රජයේ දායකත්වය ඇතිව රු.42,265,000 ක මුදලකට මිලදීගෙන තිබුණි. ඉන් යන්ත්‍ර 70 ක් නියමිත පිරිවිතර සමඟ සැසඳෙන බවට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබූ අතර, ඉතිරි යන්ත්‍ර 37 නියමිත පිරිවිතර සමඟ ගැලපේද යන්න තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පරීක්ෂා කර බලා මිලදීගැනීමට සුදුසු බවට නිර්දේශ කිරීමකින් තොරව ගබඩාවට භාරගෙන තිබුණි. මෙම Multi Chopper Diesel යන්ත්‍ර 06 ක් විගණනයේදී භෞතික පරීක්ෂාවට ලක්කළ අතර, එම යන්ත්‍ර 06 ම මිනිස් ශක්තිය යොදා ගනිමින් පණගැන්විය නොහැකි වීම හේතුවෙන් ලබාදුන් දිනයේ සිට නිශ්කාර්යව පැවතුණි.

1.5.17 ශීර්ෂය 252 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

1.5.17.1 අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2021 වර්ෂයේදී රු.2,500,000 ක ප්‍රතිපාදන මත උමන්දාව ආශ්‍රමය ආශ්‍රිතව තරුණ ව්‍යවසායකයින් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ අරමුණින් කිරිගව පාලන ඒකකයක් ඉදිකර තිබුණ ද, 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා එක් පුහුණු වැඩසටහන් පමණක් පවත්වා තිබුණි. ඒ අනුව රු.2,440,677 ක් වියදම් කර ගව පාලන ඒකකය ඉදිකිරීමේ මූලික අරමුණු ඉටුවී නොතිබුණි.	ආශ්‍රමය තුළ සමෝධායනික ගොවිපලක් පවත්වාගෙන යාම, අතුරු නිෂ්පාදන සිදු කිරීම, ජීව වායු නිෂ්පාදනය කර ප්‍රයෝජනයට ගැනීම, සත්ව පාලනය කෙරෙහි උනන්දුවක් දක්වන සේවා ලාභීන්ව දැනුවත් කිරීම යන විශාල කාර්ය භාරයක් මේ වන විටත් සිදු කරනු ලැබේ. ඒ අනුව වියදම් කළ මුදලට වඩා ඉහල ප්‍රතිඵලයක් මෙම ව්‍යාපෘතිය මඟින් ඉටු කරමින් පවතින බව.	ප්‍රතිපාදන යෙදවීමේදී ඉතාමත්ම ඵලදායී අංශ සඳහා පමණක් ප්‍රතිපාදන යෙදවීමට කටයුතු කළ යුතුය.

1.5.18 ශීර්ෂය 261 - වයඹ පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

1.5.18.1 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	**අනුකූල නොවීම**	**ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයෙහි 3 වැනි වගන්තියෙහි 3:1 සිට 3:6 දක්වා උප වගන්ති	සාමාන්‍ය වැඩ කටයුතුවලට අදාළව අතිකාල ගෙවීම් කළ නොහැකි වුවද, නිලධාරීන් 22 කුට 2024 වර්ෂයේ මාර්තු සිට ජූනි දක්වා කාලය තුළ රු. 98,554 ක අතිකාල ගෙවීම් සිදු කර තිබුණු අතර එයින් අවස්ථා 18 ක්ම විගණන වාර්තා සකස් කිරීමට අදාළ රාජකාරි සඳහා වී තිබුණි.	කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම, නවක නිලධාරීන්ගේ රාජකාරී අධීක්ෂණය කිරීමට සිදුවීම හා විශේෂ විගණන පරීක්ෂණවල නිරත වීම නිසා අතිකාල දීමනා ගෙවීමට සිදු වූ බව.	ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය.

1.5.19 ශීර්ෂය 262 - පළාත් ප්‍රතිපත්ති සම්පාදන හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව

1.5.19.1 අත්හැර දැමූ ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
පළාත් ආයෝජන වැඩසටහන සඳහා අන්තර්ජාලය පදනම් කරගත් තොරතුරු කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීමට මොඩියුල් 06 ක් යටතේ ගිවිසුම්ගත පිරිවැය රු.මිලියන 4.5 ක් වූ ව්‍යාපෘතියේ මොඩියුලය 03 හා මොඩියුල් 06 අවලංගු කර තිබුණු අතර, අවලංගු කළ 03 වන මොඩියුලය වෙනුවෙන් රු.230,696 ක අත්තිකාරමක් ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද, 2024 අවසානය වන විටත් මොඩියුල 04 හා 05 හි කොටසක් පමණක් නිම කර තිබුණි.	අවසන් ගෙවීම සිදු කරන අවස්ථාවේ මොඩියුල 04 හා 05 සම්පූර්ණයෙන් නිම කළ විට ගෙවීමට ඇති මුදලින් රු.230,696 ක අත්තිකාරම් මුදල අඩු කර ගෙවීමට කටයුතු කරන බව	අත්තිකාරම් මුදල් නිරවුල් කර ගැනිමට කටයුතු කළ යුතු වීම

1.5.20. ශීර්ෂය 263 - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

1.5.20.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ මුද්දර ගාස්තුව වූ රු.99,180,399 න්, 2024 දෙසැම්බර් 31 වන විට අය කිරීම් රු.43,963,745 ක් හා වර්ෂය තුළ දඩ පැනවීම්, නිදහස් කිරීම්, කපා හැරීම් ගැලපීමෙන් පසු 2024 දෙසැම්බර් 31 දින වන විට තව දුරටත් රු.52,134,103 ක හිඟ ශේෂයක් පැවතුණි.	හිඟ මුදල් අයකර ගැනීමට දෙපාර්තුමේන්තුව ගත හැකි සියලු ක්‍රියාමර්ග ගන්නා බව.	හිඟ මුදල් අය කරගැනීමට කටයුතු කළ යුතු වීම.

1.5.20.2 අපේක්ෂිත නිමවුම් ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 ජනවාරි 01 දිනට පැවති රු.17,900,819 ක් වූ හිඟ බදු ශේෂයෙන් වසර තුළ අයකිරීම් හා කපාහැරීම් ගැලපීමෙන් පසු රු.8,483,385 ක් 2025 මාර්තු 31 දින වන විට අයකරගෙන නොතිබුණි.	එක් නඩු ගොනුවකට අදාළ බද්ද හා දඩය කපා හැරීමට අනුමැතිය ලබාදෙන ලදි. 2024 දෙසැම්බර් 31 දිනට නඩු ගොනු 09 ක් උසාවියේ විභාග වෙමින් පවතින බව.	හිඟ මුදල් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.21 වාණිජ අත්තිකාරම් ගිණුම්

1.5.21.1 විෂය අංක 24302 - වයඹ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ ‘‘වඩු වාණිජ අත්තිකාරම් ගිණුම’’

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරි නොමැති මධ්‍යස්ථාන 19 කට අදාළ ඉඩම්වල හා මධ්‍යස්ථාන 17 ක ගොඩනැගිලි වටිනාකම	කර්මාන්ත අංශයට අදාළව මධ්‍යස්ථාන හා අලෙවිසැල් පවත්වාගෙන යනු ලබන ඉඩම් කොටස් 19 ක් දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබුණ අතර, මෙම දෙපාර්තමේන්තුව යටතේ ඇති	පරිහරණය කරනු ලබන ඉඩම්වල පරිහරණය කිරීමේ අයිතිය පවරාගැනීමට කටයුතු කළ යුතු අතර තක්සේරු කර නොමැති

පිළිවෙලින් රු.120,753,500 ක් හා රු.47,343,350 ක් විය. දීර්ඝ කාලයක සිට මෙම ඉඩම්වල පරිහරණ අයිතිය පවරා ගැනීමකින් තොරව එම ඉඩම්වල පිහිටි ගොඩනැඟිලි නඩත්තු කර තිබුණු අතර, මූල්‍ය ප්‍රකාශනවල දේපල පිරියත හා උපකරණ යටතේ වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට නොහැකි වී තිබුණි.	ඉඩම් තක්සේරු කිරීම සඳහා වූ කමිටුව විසින් මෙම ඉඩමේ තක්සේරු වටිනාකමක් නොමැති බව දන්වා ඇති බව.	ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.

1.5.21.2 විෂයය අංක 24303 - කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ ‘‘පේෂකර්ම මධ්‍යස්ථාන පවත්වාගෙන යාම’’ පිළිබඳ වාණිජ අත්තිකාරම් ගිණුම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ ජනසළු මධ්‍යස්ථාන හා අලෙවිසැල් විසින් පරිහරණය කරනු ලබන පිරිවැය වටිනාකම රු.167,275,580 ක් වූ හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 68 ක එකතු වටිනාකම රු.437,438,500 ක් වූ ජනසළු මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන ඉඩම් 68 ක අයිතිය හා මධ්‍යස්ථාන 67 ක කර්මාන්ත දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබුණි.	පවරා නොගත් ඉඩම් පවරා ගැනීමට අදාළ ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව.	අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.21.3 විෂයය අංක 25003 - දරන මාවතගම ඩෙනවර්වත්ත “පටක රෝපණ විද්‍යාගාර” වාණිජ අත්තිකාරම් ගිණුම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මාවතගම ඩෙනවර්වත්ත රජයේ ගොවිපලේ 2019 වර්ෂයේ සිට ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලබන අතර, රු.21,963,616 ක් වටිනා පටක රෝපණ විද්‍යාගාරය පිහිටි භූමි ප්‍රමාණයේ අයිතිය පවරාගෙන නොතිබුණි.	භූමි ප්‍රමාණයේ අයිතිය පවරාගැනීම සහ වටිනාකම තක්සේරු කිරීම මෙම වර්ෂය තුළ සිදු කරනු ලබන බව	අස්ථිත්වයට අදාළ වත්කම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය.

1.5.21.4 විෂයය අංක 25102 - දරන "ගොවිපල කටයුතු මෙහෙයවීම හා බිත්තර වී සැපයීම" සඳහා වූ වාණිජ අත්තිකාරම් ගිණුම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අක්කර 104 ක පමණ විශාලත්වයෙන් යුත් වාරියපොල රජයේ ගොවිපල 1918 වසරේ පමණ ආරම්භ කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළ රු.10,257,904 ක් වියදම් කර මෙම භූමිය තුළ සංවර්ධන කටයුතු සිදුකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගොවිපල පිහිටි ඉඩමේ අයිතිය පවරාගෙන නොතිබුණි.	පිළිතුරු දී නොමැත.	ඉඩම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.22 වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමුපකාර සමිතිවල මුදල් අයථා පරිහරණයක් කර ඇති බවට චෝදනා එල්ල වී තිබුණු නිලධාරියකු 2024 ජූනි 10 දිනැති අධිකාරියේ සභාපතිවරයාගේ ලිපිය මඟින් වැඩ තහනමකට ලක්කර තිබුණ ද, එම නිලධාරියා සම්බන්ධයෙන් විනය පියවරගෙන නොතිබුණි.	වැඩිදුර විමර්ශනය සඳහා ප්‍රධාන අමාත්‍යාංශයට යොමු කර ඇති බව.	විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	2024 වර්ෂයට ආරක්ෂක අංශයට අවශ්‍ය නිල ඇඳුම් රෙදි මිලට ගැනීම සඳහා මිලගණන් කැඳවීමේදී පිරිවිතර පැහැදිලිව ඉදිරිපත් කර නොතිබුණ අතර, අවම මිල ප්‍රතික්ෂේප කිරීමට නිශ්චිත හේතු තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවල දක්වා නොතිබුණ අතර, අවම මිලට වඩා වැඩි මිලකට මිලදී ගැනීම මත අධිකාරිය වෙත රු.447,280 ක අලාභයක් සිදුව තිබුණි.	ලියාපදිංචි අනෙකුත් සැපයුම්කරුවන් විසින් සාම්පල් ඉදිරිපත් නොකිරීම හා ඉදිරිපත් කර තිබුණු මිල ගණන් සාධාරණ වීම මත මිලදීගත් බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය.

(ඇ)	ආරක්ෂක හා පවිත්‍රතා සේවාවට අදාළව වැටුප් සැකසීමේ මෘදුකාංගයක් නිර්මාණය කිරීමට ආයතනයක් තෝරාගැනීම සඳහා තරඟකාරීත්වයට යොමු නොකර, පුද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 ප්‍රකාරව ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විටත් අධිකාරිය විසින් මෘදුකාංගය භාවිතා නොකර, පවිත්‍රතා හා ආරක්ෂක අංශයේ නිලධාරීන්ගේ තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීම පමණක් සිදු කර තිබුණි. ඒ අනුව 2022 වර්ෂයේ සිට නිම වූ මෘදුකාංගය මේ වන තෙක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් අධිකාරිය විසින් ගෙවූ රු.1,195,000 ක් මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි.	2025 ජූලි මාසය වන විට උපයෝජනයට කටයුතු යොදා ඇති බව.	උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.23 වයඹ ජනකලා පදනම

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	සමාලෝචිත වර්ෂයේ කුරුණෑගල විස්කම් නිවසේ මාස 09 ක්ද හලාවත විස්කම් නිවසේ මාස 11 ක්ද සහ වයඹ එක්ස්පෝර්ට් සෙන්ටර් සිට මාස 06 ක්ද, අලාභ තත්වයක් ලබාගෙන තිබුණි. එහි විස්කම් නිවාස ලාභ ලබන තත්ත්වයට පත් කිරීමට කළමනාකරණය ප්‍රමාණාත්මක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	කුරුණෑගල විස්කම් නිවස හා හලාවත විස්කම් නිවස ඉදිරිපිට නාම පුවරුවක් සකස් කිරීමට කටයුතු සංවිධානය කරන බවත්, ඉදිරියේදී සකස් කරනු ලබන වයඹ ජනකලා පදනමේ වෙබ් අඩවිය හරහාත්, Face Book සමාජ මාධ්‍ය හරහාත්, youtube channel සකස් කර ඊට අවශ්‍ය ප්‍රචාරණ කටයුතු සිදු කිරීමටත් අවශ්‍ය පියවර ගෙන ඇති බව.	අලෙවිසැල් ලාභදායී මට්ටමක පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(ආ)	සමාලෝචිත වර්ෂයේ දී ජනකලා පදනම සතු තාවකාලික හා ස්ථිර පදනම මත කඩකාමර 28 ක් බදු දීමේ දී තක්සේරු වටිනාකම මත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් බදු දීමට කටයුතු කර නොතිබුණි.	සියයට 10 ක වාර්ෂික බදු කුලී වැඩි කිරීමේ පදනම මත 2025 වර්ෂය සඳහා කඩ කාමර බදු දීම සුදුසු බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බව.	රජයේ තක්සේරු මත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර බදු දීමට කටයුතු කළ යුතුය.

1.5.24 පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය විසින් 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුළ රු.5,892,480 ක වියදම් දරා මුතුකැට සහ මිණිකැට සඟරා 107,145 ක් මුද්‍රණය කර තිබුණු අතර, එයින් වැඩිපුර සඟරා මුද්‍රණය කර තිබීම නිසා තව දුරටත් සඟරා 24,514 ක් ඉතිරිව තිබුණි.	දැනට ඉතිරි පොත් තොගය අලෙවි කිරීමට පෙරපාසල් ගුරුවරුන් කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර, ගුරුවරුන්ගෙන් අවශ්‍යතාවය විමසා ඒ අනුව අලෙවි කරන බවත් එම මුදල පාරිතෝෂික ගිණුමට බැර කිරීමටත් තීරණය කර ඇති බව.	අවශ්‍යතාවය නිවැරදිව පුරෝකථනය කර ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු අතර, ඉතිරි වැඩපොත් ප්‍රයෝජනවත් කාර්යයකට යෙදවීමට කටයුතු කළ යුතුය.
(ආ) (i)	වයඹ පළාත් පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරියේ දිවයිනේ ප්‍රථම පෙර පාසල් ගුරු පුහුණු විද්‍යාල සහ 1994 වර්ෂයේ JICA ව්‍යාපෘතිය යටතේ වයඹ පළාත තුළ පෙර පාසල් ක්ෂේත්‍රයට ආදර්ශයක් සැපයීම උදෙසා ආරම්භ කරන ලද සකුරා ආදර්ශ පෙර පාසල වසර ගණනාවක් පුරාවට නඩත්තු කටයුතු සිදු නොකිරීම හේතුවෙන් වල්බිහිවීම්/ ගරාවැටීමට ලක්වෙමින් පැවතුණි.	වයඹ පෙර පාසල් ගුරු පුහුණු විද්‍යාල අක්කර 4 ½ ක පමණ භූමි භාගයක පිහිටා ඇති අතර එහි නඩත්තු කටයුතු එකවර සිදු කිරීමට තරම් ප්‍රමාණවත් මුදලක් අධිකාරිය සතුව නොපවතී. නමුත් වසරින් වසර එම විද්‍යාලේ නේවාසිකාගාරය, දිවා සුරැකුම් මධ්‍යස්ථානය , පෙර පාසල් අංශය, ප්‍රධාන ශාලාව ආදී අංශවල ප්‍රතිසංස්කරණ කටයුතු විවිධ ව්‍යාපෘති, අමාත්‍යාංශ ප්‍රතිපාදන හා අධිකාරියේ මුදල් යොදවා සිදු කර ඇති බව.	නඩත්තු කටයුතු සිදුකර උපරිම ධාරිතාවයෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.

(ii)	සකුරා ආදර්ශ පෙර පාසල් මායිම් තාප්පය සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.1,895,000 ක් වැයකර මායිම් තාප්පයේ කොටසක් පමණක් අවසන් කර තිබුණ ද එම කොටස අවසන් වූ ස්ථානයට සමීපව මායිම් තාප්පයේ කොටසක් පෙරලී යාමට ආසන්න මට්ටමෙහි පැවතියද, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට වගකිවයුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි.	ඇස්තමේන්තුගත රු.2,596,531 කින් රු. 1,895,359 ක මුදලක් යොදවා පළමු අදියරේ වැඩ නිමකර ඇත. 2025 වසරේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ දෙවන අදියර වශයෙන් රුපියල් ලක්ෂ 50 ක මුදලක් අනුමැතිය සඳහා යොමු කර ඇති බව.	අවශ්‍යතා ප්‍රමුඛතාගත කර අවදානම අඩුකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2003 අංක 04 දරන පූර්ව ළමා අධ්‍යාපන හා සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය සහ ඊට අදාළව නිකුත් කළ අංක 1395/25 2005 ජුනි 03 දරන නියෝග මාලාවේ III වැනි උපලේඛණයේ අංක 01 වගන්තිය ප්‍රකාරව වයඹ පළාත තුළ අවුරුදු 3-5 අතර දරුවන් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන ආයතන අධිකාරිය යටතේ ලියාපදිංචි කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වයඹ පළාතේ පවත්වාගෙන යන පෙර පාසල් සංඛ්‍යාව 2152 න් ලියාපදිංචි කිරීමකින් තොරව පෙර පාසල් 713 ක් වයඹ පළාත තුළ ක්‍රියාත්මක වුවද, ප්‍රඥප්ති අඩුපාඩු හේතුවෙන් ඒ සම්බන්ධයෙන් අධිකාරියේ අධීක්ෂණයක් හා කළමනාකරණ තීරණ ගැනීමක් සිදු වී නොතිබුණු අතර, ප්‍රඥප්ති සංශෝධනය කර ගැනීමට වගකිවයුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි.	මෙම පෙර පාසල් වලට ගත යුතු නීතිමය ප්‍රතිපාදන සඳහන් කර නොමැති බැවින් ඉදිරියේ දී ප්‍රඥප්ති සංශෝධනයක් තුළින් නිසි ක්‍රියාමාර්ග ගැනිමට බලාපොරොත්තු වන බව.	පළාත තුළ ක්‍රියාත්මක පෙර පාසල් නියාමන හා අධීක්ෂණය කළ යුතුය.

(ඇ)	පූර්ව ළමා විය සංවර්ධනය ඉතාමත් ප්‍රමිතිගතව සිදුවිය යුතු වුවත්, පළාත තුළ අලුතින් බිහිවන ජාත්‍යන්තර පාසල්වල ස්වරූපයෙන් පිහිටුවා ඇති සියලු පෙර පාසල් පළාත් සභාවෙන් හෝ මධ්‍යම රජයෙන් නියාමනය නොවන, බැවින් කිසිදු නියාමනයකට ලක්නොවන ව්‍යාපාර ලියාපදිංචිය පිළිබඳ සහතිකයක් පමණක් ඇති ව්‍යාපාර සංවිධාන බවට පත්ව තිබුණි.	වාණිජ මට්ටමෙන් පවත්වාගෙන යන පෙර පාසල් ද පවතින අතර එම පෙර පාසල් සම්බන්ධයෙන් කටයුතු කිරීමට තරම් අධිකාරියේ ප්‍රඥප්තිය බලවත් නොවන බැවින් ඉදිරි ප්‍රඥප්ති සංශෝධනයේ දී මෙම ගැටළු වලට විසඳුම ලබා ගැනීමට අවශ්‍ය නීති රීති ප්‍රඥප්ති කෙටුම්පතට ඇතුළත් කර ඇති බව.	පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන ආයතන නියාමනයට කටයුතු කළ යුතුය.

1.5.25 වයඹ පළාත් පරිසර අධිකාරිය

		විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	(i)	1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ 12 (1) වගන්තිය අනුව බඳවාගැනීම් කාර්ය පටිපාටියට අනුකූලව සේවකයින් බඳවාගතයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා අධිකාරිය සඳහා බඳවාගැනීමේ කාර්ය පරිපාටියක් සකස් කර අනුමත කරගෙන නොතිබුණු අතර, ඉන් පරිබාහිරව සේවකයින් බඳවා ගැනීම, උසස් කිරීම හා වැඩ බැලීමට පත් කිරීම සිදුකර තිබුණි.	පිළිතුරු ලබාදී නොමැත.	ඉතා කඩිනමින් බඳවා ගැනීමේ කාර්ය පටිපාටිය අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය.
	(ii)	2018 ජූනි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2018 හි II හා 2020 ඔක්තෝබර් 26 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2020 හි 2 (I) අනුව අධිකාරිය	කළමණාකරන සේවා තනතුර සඳහා මානව සම්පත් සංවර්ධන අධිකාරිය මඟින් අනුයුක්ත කර ඇත. කළමණාකරන සේවා නිලධාරි තනතුරේ පවතින ඌනතාවය මෙන්ම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වී නොමැති	අනුමැතියකින් තොරව බඳවා ගැනීම් සිදු නොකළ යුතුය.

	විසින් බඳවාගැනීමේ පරිපාටියක් අනුමත කරගෙන නොමැති බැවින් සේවකයින් බඳවාගැනීමට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගතයුතු වුවත්, අනුමැතියකින් තොරව පසුගිය වසර 05 තුළ නිලධාරීන් 05 දෙනෙකු අධිකාරිය සඳහා බඳවාගෙන තිබුණි.	බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව සේවා අවශ්‍යතාවය මත අනුයුක්ත කර ගෙන ඇති බව.	
(ආ)	මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙනත් මූල්‍ය වත්කම් යටතේ වර්ෂ ගණනාවක සිට දක්වා ඇති EIA පරීක්ෂණ වෙනුවෙන් අයවිය යුතු රු.215,803 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබාදී නොමැත.	එම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	වයඹ පළාත් ප්‍රධාන ලේකම්ගේ 2014 ජනවාරි 28 දිනැති 01/2014 අංක දරන චක්‍රලේඛයේ 1.2.1 වගන්තිය හා සංශෝධන ප්‍රකාරව විධායක අධ්‍යක්ෂවරයාට මාසිකව ලීටර් 116 ක වටිනාකමකට සමාන ඉන්ධන දීමනාවක් හිමිවේ. වයඹ පළාත් පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ වෙත ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් 2019 ජූනි 26 දිනැති ලිපිය මඟින් PH – 0262 දරන වාහනය නිල වාහනයක් ලෙස වෙන්කර තිබූ අතර, එම වාහනය සඳහා 2023 වර්ෂයේ හා 2024 වර්ෂයේ අගෝස්තු මස දක්වා සීමාව ඉක්මවා රු.1,574,187 ක් වටිනා ඉන්ධන ලීටර් 4.068.9 ක් ලබාගෙන තිබුණි.	පිළිතුරු ලබාදී නොමැත.	සීමාව ඉක්මවා ගෙවූ ඉන්ධන වටිනාකම අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.26 වයඹ කර්මාන්ත සේවා කාර්යාංශය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කෘෂිකාර්මික අංශ නවීකරණය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.167,763,500 ක වටිනාකමකට කර්මාන්ත සේවා කාර්යාංශය හා කෘෂිකර්ම අමාත්‍යාංශය ගිවිසුම්ගත වී තිබූ අතර දිස්ත්‍රික්ක 12ක ප්‍රතිලාභීන් 14,000 ක් පුහුණු කළ යුතු වුවත් සත්‍ය වශයෙන්ම පුහුණු වී පැවති ප්‍රතිලාභීන් ගණන 6,259 ක් විය. ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිට ලැබී තිබූ වටිනාකම හා ලැබිය යුතු වටිනාකමේ එකතුව රු.108,375,243 ක් විය. ඒ අනුව ලබාගත හැකිව තිබූ රු.59,388,257 ක ආදායමක් කාර්යාංශයට අහිමි වී තිබුණි.	දෛනික ජීවන රටාවෙන් ඔබ්බට ගොස් මෙවැනි වැඩසටහන් වලට ගොවීන්ගේ සහභාගීත්වය ලබා ගැනීමට සහ ඔවුන්ගේ පැමිණීම නොකඩවා රඳවා ගැනීම ඉතාමත් අපහසු කාර්යයක් වූ බැවින් තෝරාගත් ගොවීන්ගෙන් බඳවාගත හැකි වූයේ ප්‍රතිලාභීන් 11,347 ක් බව.	මනා අධ්‍යයනයක් හා විධිමත් මහපෙන්වීමක් හා අධීක්ෂණයකින් යුතුව සැලසුම් සහගතව කටයුතු කර ගිවිසුම් ගත ආදායම් උපයා ගැනීම හා අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ජ්‍යෝෂ්ඨ උපදේශක යන අනුමත තනතුරු නාමය යටතේ 2023 වර්ෂයේදී අතිරික්ත තනතුරු දෙකක් වෙනුවෙන් රු.1,933,962 ක වටිනාකමක් වැටුප් ලෙස ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී පුරප්පාඩු 01 ක් පමණක් තිබියදී එම නිලධාරීන් දෙදෙනාවම සහකාර අධ්‍යක්ෂ තනතුරට උසස් කිරීම හේතුවෙන් 2024 අප්‍රේල් 01 දින සිට අනුමත නොවන තනතුරකට ගෙවීම්කර තිබුණු වැටුප රු.96,255 ක් වීම හේතුවෙන් 2023 සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අවිධිමත් ලෙස වැටුප් වශයෙන් ගෙවීම් කර තිබුණු මුදල රු.2,030,217 ක් විය.	ඔවුන් විසින් ලබා ගෙන ඇති කාර්ය සාධනය සහ විධායක අධ්‍යක්ෂකගේ පූර්ණ නිර්දේශය මත කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම නිලධාරීන්ගේ උසස් වීම් අනුමත කර ඇතිබව .	අනුමත තනතුරු සංඛ්‍යාව සඳහා පමණක් සේවකයින් බඳවා ගත යුතුය.

(ඇ)	ආයතනය වෙනුවෙන් බඳවාගැනීමේ පටිපාටියක් අනුමතව නොතිබියදී 2024 වර්ෂය තුළදී තනතුරු 06 ක් සඳහා නිලධාරීන් 10 දෙනෙකු බඳවාගෙන පැවති අතර ඉන් නිලධාරීන් 07 දෙනෙකු අනුමත කාර්ය මණ්ඩලයේ සීමාව ඉක්මවා තිබූ අතර මෙම අනුමත නොවන තනතුරු වලට අදාළව සමාලෝචිත වර්ෂය තුළදී ගෙවීම් කර තිබුණු වැටුප් ප්‍රමාණය රු.3,601,860 විය.	බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත කර ගැනීමට අදාළ කාර්යයන් මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතින බව.	අනුමත බඳවා ගැනීමේ පටිපාටියකට අනුව අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව පමණක් බඳවා ගත යුතුය.
(ඈ)	නිලධාරීන් 07 දෙනෙකු වෙත 2024 වර්ෂයේදී වැටුප් වර්ධක කිහිපයක් එකවර ලබාදී උසස්වීම් කර තිබූ අතර එම නිලධාරීන් 07 දෙනා වෙත සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාල සීමාව තුළ ඒ වෙනුවෙන් රු.250,740 මුදලක් අමතරව ගෙවා තිබුණි.	2023 වර්ෂයේ කාර්ය සාධන ඇගයීම් මත ආයතනයේ නිලධාරීන් 07 දෙනෙකු වෙත අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ අනුමැතිය යටතේ මෙම උසස් වීම් ලබා දී ඇති බව.	බඳවා ගැනීමේ පටිපාටි අනුමත කරගෙන ඒ අනුව සේවකයින්ට වැටුප් වර්ධක ගෙවිය යුතුය.
(ඉ)	කාර්යාංශය තුළ නිලධාරීන් 04 දෙනෙකුට 2021 සිට 2023 දක්වා කාල සීමාව තුළ අවිධිමත් ලෙස වැටුප් වර්ධක 2-3 අතර ප්‍රමාණයක් එකවර ලබාදී උසස්කිරීම් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මාර්තු දක්වා රු.235,695 ක මුදලක් අවිධිමත් ලෙස වැඩිපුර වැටුප් වශයෙන් ගෙවා තිබුණි.	කාර්යාංශයේ මානව සම්පත් කළමනාකරනය සහ පරිපාලනය ඉතාමත් වැදගත් අංශයක් වන අතර මෙම කාර්ය මණ්ඩල සංශෝධනය සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත අනුමැතිය සඳහා යවා ඇති බව.	බඳවා ගැනීමේ පටිපාටියන් අනුමතකරගෙන ඒ අනුව සේවකයින්ට වැටුප් වර්ධක ගෙවිය යුතුය.
(ඊ)	කාර්යාංශය විසින් 2022 හා 2023 යන වර්ෂයන් සඳහා පිළිවෙලින් රු.2,252,673 ක් හා රු.11,512,185 ක් ලෙස ශුද්ධ ලාභයක් උපයා පැවතියද සමාලෝචිත වර්ෂයේ විගණිත දිනය දක්වා ඊට අදාළ බදු මුදලක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත 2017 අංක 24 දරන දේශීය	1990 අංක 11 දරන වයඹ කර්මාන්ත සේවා කාර්යාංශ ප්‍රඥප්තියට අනුව පිහිටුවා ඇති කර්මාන්ත සේවා කාර්යාංශය ලාභ නොලබන රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස පිහිටුවා ඇත. සමුච්චිත අරමුදලක් ලෙස පවත්වාගෙන යන අරමුදලට අනුරූපීව රාජ්‍ය ආයතනයක් ලෙස	2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ 2 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	ආදායම් බදු පනතේ 2 (1) වගන්තිය ප්‍රකාරව ගෙවා නොතිබුණි.	ආදායම් බදු මුදල් ගෙවීම සම්බන්ධයෙන් මතභේදාත්මක තත්වයක් පැන නැගී ඇත. කෙසේ වෙතත් ඔබ විසින් පෙන්වා දී ඇති කරුණ පිළිබඳ ඉදිරියේ දී සලකා බලන බව.	
(උ)	කාර්යාංශය විසින් ඉටුකරනු ලබන ව්‍යාපෘතිවලට අදාළව සිදුකළ යුතු කාර්යභාරයන් පිළිබඳ නිසි අධ්‍යයනයකින් හෝ සැලසුමකින් තොරව ඇස්තමේන්තු සකස්කර තිබීම මත කාර්යාංශයේ නිලධාරීන් වෙත ඉහල වටිනාකම් යටතේ අග්‍රිම ලබාදී තිබීම හේතුවෙන් අවස්ථා 48 ක දී ලබා දී තිබූ අග්‍රිමවල වටිනාකම රු.5,647,600 ක් වුවද, එකී අග්‍රිම වලින් වියදම් කිරීමකින් තොරව නිලධාරීන් 6 ක් විසින් එකතු වටිනාකම රු.2,030,600 ක් වූ අග්‍රිම කිසිදු කාර්යයක් සඳහා භාවිතා නොකර වැඩකරන දින 2 ත් 4 ත් අතර කාල පරාසයක් අතරඳවාගෙන තිබූ අතර ඉතිරිය රු.2,088,007 ක් වටිනාකම වූ අග්‍රිම දින 14 ක කාලසීමාව ඉක්මවා වැඩකරන දින 1 ත් 23 ත් අතර කාල පරාසයක් අතරඳවාගෙන පියවා තිබුණි.	නිකුත් කළ අත්තිකාරම් ඉතාමත් සැලකිලිමත්භාවයෙන් නිකුත් කළ අතර සමහර අවස්ථා වල දී සැලසුම් ගත වැඩ කටයුතු කල්දැමීම, අවලංගු වීම ආදී කරුණු නිසා මෙම මුදල් නැවත පියවීමට සිදු වී ඇත. කාර්යාංශය විසින් තවදුරටත් මේ පිළිබඳ විශේෂ අවධානය යොමුකර කටයුතු කරන අතර මුදල් නැවත භාරදීමේදී හෝ වැඩිපුර වියදම් කිරීමට අදාළව විධිමත් හේතුකාරණා විමසා බලා කටයුතු කරන බව.	නිවැරදි ඇස්තමේන්තු අනුව අත්තිකාරම් ලබා දීමට කටයුතු කළ යුතුය.
(ඌ)	ආයතන සංග්‍රහයේ III වැනි පරිච්ඡේදයේ 2.1 වගන්තිය අනුව, වයඹ පළාත් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ IV වැනි පරිච්ඡේදයේ 30 වැනි කරුණ හා කර්මාන්ත සේවා කාර්යාංශය විසින් අනුමත කරගෙන පැවති පරිපාලන හා ආයතන රීති සංග්‍රහයේ IV වන පරිච්ඡේදයේ 2 වන වගන්තිය අනුව සෑම තනතුරකටම අදාළ බඳවා ගැනීමේ පටිපාටියක් පිළියෙල කරගත යුතු වුවත් කාර්යාංශයට අදාළ තනතුරු අනුමත වී වසර 12 කට ආසන්න කාලයක් ගතව	2012 සැප්තැම්බර් 18 දින එවකට පැවති කාර්ය මණ්ඩලයට අනුව සේවකයින් 34 ක් සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමැතිය ලැබී තිබූ අතර, එකී තනතුරු පදනම් කර ගෙන කර්මාන්ත සේවා කාර්යාංශය මඟින් බඳවා ගැනීමේ පටිපාටි සකස් කර කඩඉම් මඟින් ඉදිරිපත් කර ඇති බව.	ආයතන සංග්‍රහයේ III වැනි පරිච්ඡේදයේ 2.1 කරුණ, වයඹ පළාත් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ IV වැනි පරිච්ඡේදයේ 30 හා රීති සංග්‍රහයේ IV වන පරිච්ඡේදයේ 2 ප්‍රකාර සෑම තනතුරකටම අදාළව බඳවා ගැනීමේ පටිපාටියක් පිළියෙල කර ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතුය.

	පැවතියද බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.		

1.5.27 වයඹ සංවර්ධන අධිකාරිය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1993 අංක 01 දරන වයඹ සංවර්ධන අධිකාරි ප්‍රඥප්තියේ I වන කොටසේ 4 වන ඡේදය ප්‍රකාරව අරමුණු 10 ක් දක්වා පැවතියද ඉන් අරමුණු 08 කට අදාළ කාර්යයන් මේ වන විට අධිකාරිය විසින් සිදුනොකරන අතර වෙනත් අරමුණු ඉටුකරගැනීම වෙනුවෙන් අධිකාරිය කටයුතු කළද එම අරමුණු ඇතුළත් කොට ප්‍රඥප්තිය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	වයඹ සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තිය සංශෝධනය කර කඩඉම් මඟින් යොමුකර ඇති බව.	අදාළ අරමුණු ළඟාකර ගැනීමට ආයතනය කටයුතු මෙහෙයවිය යුතුය.
(ආ)	මදුරන්කුලිය සංචාරක තොරතුරු පහසුකම් මධ්‍යස්ථානයේ 2018 සැප්තැම්බර් 01 දින වසර 05 ක කාල සීමාවකට පෞද්ගලික ආයතනයකට බදු දී තිබුණු නමුත්, 2025 ජනවාරි 15 දක්වා හිඟ බදු මුදල රු.10,609,212 ක් වූ අතර බදු ගිවිසුමේ 6 වන වගන්තිය අනුව නියමිත දිනට පසු සිදුකරන ගෙවීම් වෙනුවෙන් අයකළ යුතු අධිභාර මුදල ද අයකර නොතිබුණි. 2018 සිට 2023 දක්වා වසර 05 ක කාලය තුළ මෙහෙයුම් කටයුතු ආරම්භ කර පවත්වාගෙන යාමට අසමත් වූ හා කිසිදු බදු මුදලක් නොගෙවූ පෙර බදු ගැනුම්කාර පාර්ශවය වෙතම ටෙන්ඩර් කැඳවීමකින් තොරව ආණ්ඩුකාරවරයාගේ 2023 ජූනි 24 දිනැති අංක 012/23 දරන ලිපිය මඟින් නැවත 2024 ජනවාරි	2019 වර්ෂයේ පාස්කු ප්‍රහාරය හා 2020 මාර්තු මාසයේදී ඇතිවූ Covid -19 වසංගත තත්වය හමුවේ සහන කාලයන් ලබාදෙන මෙන් කරනු ලැබූ ඉල්ලීම් ලිපි අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් හා ඒ සම්බන්ධව වයඹ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් ලබාදී ඇති උපදෙස් අනුව සහන කාලයන් ලබා දී ඇත. මෙම කාලසීමාව තුළ ස්ථානයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබූ බැවින් එම කාලසීමාව තුළ බදු මුදල් හා අධිභාර අයකර ගැනීමට හැකියාවක් නොතිබුණ බව.	මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය.

	12 සිට වසර 30 ක කාලයකට අවිධිමත් ලෙස බදු ලබා දී තිබූ නමුත් මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු ආරම්භකර නොතිබුණි.		
(ඇ)	අධිකාරියට අයත් ගොඩනැගිල්ලේ පවත්වාගෙන යනු ලබන හෝටල් පාසල සඳහා 2024 වර්ෂයේ තක්සේරු කුලී වටිනාකම රු.5,400,000 ක් වූ නමුත් 2024 වර්ෂය වෙනුවෙන් ගෙවා තිබූ කුලී වටිනාකම රු.3,360,000 ක් වූයෙන් රු.2,040,000 ක් අඩුවෙන් කුලී අයකරගෙන තිබූ අතර 2022 හා 2023 වර්ෂයන් හිදී ද අඩුවෙන් අයකරගෙන තිබීම මත සිදුවූ මූල්‍යමය අලාභය රු.4,080,000 ක් විය. ඒ අනුව ඉකුත් වසර 03 සඳහා අධිකාරියට සිදුව පැවති සමස්ථ අලාභයේ වටිනාකම රු.6,120,000 ක් විය.	පළාතට හා අධිකාරියට ලැබෙන ආර්ථික හා ආර්ථික නොවන ප්‍රතිලාභ සලකා මාසික බදු කුලිය ලෙස රු. 280,000 ගෙවීම සඳහා දෙපාර්ශවය එකඟ වී ඇති බව හා 2025 වර්ෂයට අදාළ තක්සේරු වටිනාකම වන රු. 450,000 ක මුදල ගෙවීමට එකඟතාවය පලකර ඇති බව.	රජයේ තක්සේරු වටිනාකම අයකරගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	බඩගමුව පරිශ්‍රයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ අංක 03 හා 04 යන කඩකාමර එකක් වෙනුවෙන් ලද තක්සේරුගත වටිනාකම රු.50,000 ක් වුවත් 2021 මාර්තු 15 දින සිට 2022 අප්‍රේල් 28 දක්වා මාස 13 කට ආසන්න කාලයක් අදාළ දේපල වෙනුවෙන් රු.33,000 බැගින් අයකිරීම හේතුවෙන් අධිකාරියට සිදුව තිබූ පාඩුව රු.221,000 ක් වූ අතර 2022 සැප්තැම්බර් 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා මාස 27 ක් සඳහා රු.32,500 බැගින් අයකිරීමෙන් අධිකාරියට සිදුව තිබූ පාඩුව රු.472,500 ක් විය. ඒ අනුව මෙම කඩ කාමර දෙකෙන් අඩුවෙන් කුලී අයකිරීම නිසා සිදුව පැවති මුළු පාඩුව රු.693,500 ක් විය.	අංක 03 හා 04 යන කඩකාමර දෙකම එක් කඩකාමරයක් ලෙස පවතින අතර තක්සේරු වටිනාකම ගණනය කිරීමේදී එය කඩකාමර 02 ක් ලෙස සලකා තක්සේරුගත වටිනාකම රු.50,000 ක් ලෙස දක්වා ඇති බව. කඩකාමරය සඳහා අවම බදු කුලිය රුපියල් 32,000 ක් ලෙස ගණනය කර ඇති අතර, ඉදිරිපත් කර තිබූ ලංසු මුදල අනුව බදු අයකර ඇති බව.	රජයේ තක්සේරු වටිනාකම අයකරගැනීමට කටයුතු කළ යුතුය.

(ඉ)	අධිකාරියට අයත් කඩකාමර හා පරිශ්‍රයන් 06 කින් 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය අවසානය දක්වා අයවීමට ඇති හිඟ බදු මුදලේ වටිනාකම රු.436,231 ක් වූ අතර, කඩ කාමර සඳහා බදුකුලී ගෙවීමේ ප්‍රමාදය මත ගිවිසුම් ප්‍රකාරව අයකළ යුතු ප්‍රමාද ගාස්තු වෙනුවෙන් පරිශ්‍රයන් 08 ක් වෙතින් 2022 ඔක්තෝබර් සිට 2024 දෙසැම්බර් දක්වා අයකළ යුතුව පැවති දඩමුදලේ මුළු වටිනාකම රු.502,222 ක් විය.	පිළිතුරු ලබා දී නොමැත.	හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.28 වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය

	විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කුලී ගාස්තු, අළුත්වැඩියා ගාස්තු, සේවා ගාස්තු හා සිවිල් වැඩ ගාස්තු වශයෙන් 2025 මාර්තු 31 වන විට ලැබිය යුතු ශේෂය රු.19,000,459 ක් වන අතර එයින් වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන රු.8,736,646 ක් විය. ණය ශේෂය අයකර ගැනීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විට කටයුතු කර නොතිබුණි.	2025 මාර්තු 31 දින වන විට රු.19,000,459 ක මුදලක් තව දුරටත් ලැබීමට හිඟ මුදල් ලෙස පැවති බව.	ණය ශේෂයන් අයකරගැනිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	අධිකාරියේ කළමනාකරණ අධ්‍යක්ෂ තනතුර සඳහා 2015 දෙසැම්බර් මස සිට පුරප්පාඩුව පැවති අතර, ඒ සඳහා ස්ථිර නිලධාරියෙකු පත් නොකර වර්ෂ 09 ක කාල පරිච්ඡේදය තුළ වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් පත්කර තිබුණි.	අධිකාරියේ කළමණාකාර අධ්‍යක්ෂ තනතුර සඳහා පූර්ණ කාලීන නිලධාරීවරයකුගේ අවශ්‍යතාවය පිළිබඳව කිහිප අවස්ථාවකදීම වයඹ ප්‍රධාන අමාත්‍යාංශය දැනුවත් කර ඇති බව.	ස්ථිර පදනමින් කළමනාකරණ අධ්‍යක්ෂ තනතුර සඳහා නිලධාරියෙකු බඳවාගත යුතුය.

(ඇ)	අධිකාරියට අයත් රු.9,300,000 ක වටිනාකමක් සහිත වාහන 04 ක් මාස 06 සිට වර්ෂ 05 දක්වා කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවති අතර රු.3,200,000 ක් වටිනා ලොරි රථයක් හා ටිපර් රථයක් අලුත්වැඩියා කර නොතිබීමෙන් නිශ්කාර්යව පැවතුණි.	68-5439 අංක දරන ටිපර් රථය ගියර් පද්ධතියේ අලුත්වැඩියාවන් සිදු කරමින් පවතින අතර 26-0005 අංක දරන ජල බවුසරය ධාවන තත්වයේ පවතින අතර සුදුසු වැඩබිමක් ලද පසු සේවයට යොදවනු ලැබේ. 28-3594 හා 28-3595 අංක දරන වාහන ආයතනය විසින් දැනට වසර 15 කට පමණ පෙර කාලයේ භාවිතා කළ ජංගම සේවා රථ වේ. නමුත් වර්තමානයේදී වැඩි පිරිවැයක් දරා මෙම ජංගම රථ භාවිතා කර අලුත්වැඩියා කටයුතු සිදු කර ගැනීමේ අවශ්‍යතාවයක් ඇති නොවූ බැවින් මෙම රථ ධාවනයේ නොයොදයි. නමුත් මෙම රථ වල පවතින වැඩහලේ ප්‍රයෝජනයට ගත හැකි උපාංග භාවිතයට ගෙන ඇත.	උපයෝජනයට ගැනීමට, වෙනත් අවශ්‍ය ආයතනයකට ලබාදීමට හෝ අපහරණය සඳහා කටයුතු කළ යුතුය.

1.5.29 වයඹ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

	විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1995 අංක 04 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 28 ජේදය ප්‍රකාරව මගී සේවා අවසර පත්‍රයක් පැවරිය නොහැකි බව දක්වා තිබූ අතර 2018 අංක 07 දරන 2023 දෙසැම්බර් 16 අනුමත කරන ලද මගී ප්‍රවාහන සේවා සංශෝධිත ප්‍රඥප්තියේ බලපත්‍ර පැවරීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් සඳහන් කර නොතිබුණි. බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ නියෝග සකස් කිරීමද 2025 වර්ෂයේ පෙබරවාරි මස දක්වා සිදුකර නොතිබුණු අතර කිසිදු ප්‍රතිපාදනයක් නොමැතිව 2024	2018 අංක 07 දරන 2023 දෙසැම්බර් 31 දින ප්‍රසිද්ධ කරන ලද මගී ප්‍රවාහන සේවා සංශෝධිත ප්‍රඥප්තියේ 11 වන කොටසෙහි පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ බලතල හා කාර්යයන් යටතේ අංක 19 (l) යටතේ බලපත්‍ර පැවරීම සම්බන්ධයෙන් ප්‍රතිපාදන ලැබී ඇත. සංශෝධන ප්‍රඥප්තිය සඳහා මේ වන විට නියෝග සෑදීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.නව සංශෝධිත ප්‍රඥප්තියෙන් අයිතිය විධිමත් කිරීම සඳහා බලතල පැවරී ඇති බව.	බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් විධිමත් රීතින් සකස් කොට ක්‍රියාත්මක කළයුතුය.

	වර්ෂය තුළ රු.51,700,000 ක් වූ මාර්ග බලපත්‍ර 140 ක අයිතිය පැවරීමට කටයුතු කර තිබුණි.		
(ආ)	2013 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාළව අධිකාරිය වෙත ලැබිය යුතු මාසික ධාවන සටහන් පත්‍ර ගාස්තු 2025 මාර්තු 31 රු.12,425,500 ක් හා ප්‍රමාද ගාස්තු රු.2,452,150 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.	2025 මාර්තු 31 දින වන එම හිඟ මාසික ධාවන සටහන් පත්‍ර ගාස්තුව හා ප්‍රමාද ගාස්තුව පිළිවෙලින් රු.12,425,500 ක් හා රු.2,452,150 ක් වේ.	ලැබිය යුතු ආදායම් අයකරගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2013 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලයට අදාළව ලැබිය යුතු පිවිසුම් පත්‍ර ආදායම් රු.2,040,800 ක් හා ප්‍රමාද ගාස්තු රු.362,200 ක් අයකරගැනීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.	අය වී නොමැති ප්‍රමාද ගාස්තු 2025 මාර්තු 31 දිනට ද අය වී නොමැති බව .	ලැබිය යුතු ආදායම් අයකරගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලයට අදාළ ලැබිය යුතු අමතර ගමන්වාර ආදායම රු.2,440,000 ක් හා ප්‍රමාද ගාස්තු රු.692,100 ක් සමාලෝචිත වර්ෂය තුළදී අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.	2025 මාර්තු 31 දිනට අය වීමට ඇති අමතර ගමන්වාර ගාස්තුව රු.2,322,000 ක් හා ප්‍රමාද ගාස්තුව රු.661,100 ක් බව.	ලැබිය යුතු ආදායම් අයකරගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	2014 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් දක්වා කාලයට අදාළව 2025 මාර්තු 31 දින වන විට අයවීමට ඇති රු.89,000 ක හිඟ සේවා ගාස්තු සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයකරගැනීමට නොහැකිව පැවතුණි.	හිඟ සේවා ගාස්තු ශේෂය හිඟ ශේෂය සහිත බස්රථ ධාවනයෙන් ඉවත්වීම හා අවලංගුවීම් සිදු වී ඇති බැවින් අවස්ථානුකූල අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව.	ලැබිය යුතු ආදායම් අයකරගැනීමට කටයුතු කළ යුතුය.
(ඊ)	අධිකාරිය විසින් 2011 වර්ෂයේ සිට 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ටෙන්ඩර් මඟින් හා අයිතිය විධිමත් කිරීම	හිග බලපත්‍ර ගාස්තු ශේෂය රු.2,096,000 ක් වේ. එම බලපත්‍ර ධාවනයෙන් ඉවත් වී අවලංගු තත්ත්වයේ ඇති බව.	ලැබිය යුතු ආදායම් අයකරගැනීමට කටයුතු කළ යුතුය.

	යටතේ නව බලපත්‍ර ලබාදීමේදී කොටස් වශයෙන් මුදල් ගෙවීමට ලබාදුන් බලපත්‍ර 23 කට අදාළව අයවීමට ඇති හිඟ මුදල රු.2,096,000 සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.		
(උ)	සමාලෝචිත වර්ෂයේ රියදුරු අභ්‍යාස විද්‍යාලයේ මෙහෙයුම් අලාභය රු.2,977,420 ක් වූ අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව එය රු.792,320 කින් වැඩිවී තිබුණි. රියදුරු පාසලේ ක්‍රියාකාරීත්වය හා ඵලදායිතාව ඉහල නංවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම මත පුහුණුලාභීන් පසුගිය වර්ෂයට සාපේක්ෂව 71 කින් අඩුවීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.	විශේෂයෙන් 2023 වර්ෂයේ විවිධ සමිති, පරිවාස දෙපාර්තුමේන්තුව වැනි රජයේ ආයතන විසින් කණ්ඩායම් වශයෙන් විවිධ ප්‍රතිපාදන යටතේ පුහුණුව සඳහා යොමු කරන ලදී.නමුත් 2024 වර්ෂයේ එසේ කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් නොවීම මත ආදායම් තත්වය පහළ යන ලද බව.	රියදුරු අභ්‍යාස විද්‍යාලයේ කටයුතු පිළිබඳව අවධානය යොමුකර ආදායම් ඉහලනංවාගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඌ)	2019 වර්ෂයේ සිට අළුත්කිරීමට කටයුතු නොකළ මාර්ග බලපත්‍ර 132 ක් 2024 වර්ෂය තුළ අවලංගු කිරීමට කටයුතු කර තිබූ අතර එම බලපත්‍ර වලට අදාළ බස් රථ වෙනුවෙන් 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලැබිය යුතු මාසික ධාවන සටහන් පත්‍ර ආදායම් හා ප්‍රමාද ගාස්තු රු.1,118,100 ක් කිසිදු අනුමැතියකින් තොරව 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත්කර තිබුණි.	මෙම බලපත්‍රවලට අදාළ හිග මුදල් ගෙවා අය කර ගැනීමට හැකියාවක් නොමැති බැවින් අතපසුවීමකින් ලේඛණයකින් ඉවත් කර ඇත. මෙම කපා හැරීම විධිමත් ක්‍රමවේදයකට අනුව සිදු වී නොමැති බැවින් ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල හා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන විධිමත් පරිදි කපාහැරීමට කටයුතු කරනු ලබන බව.	විධිමත් අනුමැතීන් ලබාගැනීමෙන් අනතුරුව පමණක් ලැබිය යුතු ආදායම් ගිණුම්වලින් ඉවත්කිරීමට කටයුතු කළ යුතුය.
(එ)	අධිකාරිය සතු කැබ්රථයක් 2023 නොවැම්බර් 20 දින අළුත්වැඩියාව සඳහා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත යොමුකර රු.3,400,000 ක වියදමක් දරා අළුත්වැඩියා කර තිබුණද 2025 පෙබරවාරි 28 දින දක්වා කැබ් රථය ගාස්තු ගෙවා අධිකාරිය වෙත රැගෙන	කැබ් රථය අළුත්වැඩියා කිරීම සම්බන්ධව ප්‍රධාන ලේකම් මගින් පත්කරන ලද කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමට 2025 අප්‍රේල් 29 දින අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලද අතර ඒ අනුව මේ වන විට කැබ් රථය ලබා ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව.	වාහනය අධිකාරිය වෙත ලබාගෙන ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.

	යාමට කටයුතු කර නොතිබීමෙන් වර්ෂයකට අධික කාලයක් වාහනය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.		
(ඒ)	ආයතන සංග්‍රහයේ ii පරිච්ඡේදයේ 13.2 ඡේදය අනුව වැඩබැලීමේ පත්කිරීමක් කළයුත්තේ නිත්‍ය තනතුරට පත්කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වුවද, අධිකාරියේ කළමනාකරණ මට්ටමේ සියළු තනතුරු සඳහා වර්ෂ 02 සිට වර්ෂ 05 දක්වා කාලයක් තනතුරුවල වැඩබැලීමට නිලධාරීන් පත්කර තිබුණු නමුත්, ස්ථිර නිලධාරීන් බඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.	දැනට සේවයේ නියුතු නිලධාරින්ගේ පළපුරුද්ද සැලකිල්ලට ගෙන මෙම වැඩබලන තනතුරු ලබාදී ඇත්තේ ආයතනයේ දෛනික රාජකාරි කටයුතු නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහායි. ඉදිරියේදී අවස්ථානුකූලව ස්ථිරව බඳවා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සකස් කරමින් සිටින බව.	ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය.
(ඔ)	2014 සැප්තැම්බර් 11 දින පැවති ගිණුම්කාරක සභාවේදී මගී මාර්ග බලපත්‍ර ලබාදීමට එක් විධිමත් ක්‍රමවේදයක් තෝරා ගැසට් කරන ලෙස දන්වා තිබුණද තීරණය ලබාදී වසර 09 ක් ගතවුවද එය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	1995 අංක 04 දරන ප්‍රඥප්තියේ 17 වගන්තියෙහි 02.01 යටතේ 2016, 2019, 2023 හා 2024 වර්ෂවල ටෙන්ඩර් ක්‍රමවේදය අනුගමනය කරමින් මාර්ග බලපත්‍ර ලබා දී ඇති බව.	අයිතිය පැවරීම් කිරීම හා ටෙන්ඩර් ක්‍රමවේදය යන ක්‍රම දෙකම යටතේ බලපත්‍ර ලබාදීම සිදුකරන අතර එක් ක්‍රමයක් තෝරාගැනීමට කටයුතු කළ යුතුය.

1.5.30 වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2001 අංක 01 දරන වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තියේ 23 (1) වගන්තිය අනුව අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් මෙම ප්‍රඥප්තියෙහි මින්	කළමනාකරණ අධ්‍යක්ෂ තනතුර සඳහා සෘජු බඳවා ගැනීම් කළහොත් ගෙවීමට සිදුවන වැටුප් හා දීමනා මුදල විශාල බැවින් ආයතනයට පාලනය කරගත නොහැකි බවත්, පළාත් සභාවෙන් ප්‍රතිපාදන	2001 අංක 01 දරන වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරි ප්‍රඥප්තියේ 23(1) වගන්තිය හා ආයතන සංග්‍රහයේ VII වැනි

	මතු කළමනාකරණ අධ්‍යක්ෂවරයා වශයෙන් හඳුන්වනු ලබන පූර්ණකාලීන සේවය යෙදිය හැකි තැනැත්තෙකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළයුතුය. එසේම ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12.2.3 වගන්තිය අනුව යම් පුද්ගලයෙකු වැඩ බැලීමට පත්කරනු ලබන තනතුර පූර්ණකාලීන මෙන්ම, ළඟදීම පූර්ණකාලීන නිලධාරියෙකු පත්කිරීමට අදහස් කරන තනතුරක් විය යුතු වුවත්, 2017 සිට 2025 අප්‍රේල් 30 දින දක්වා අඛණ්ඩව එම තනතුරෙහි වැඩබැලීම සඳහා නිලධාරියෙකු පත්කර තිබුණි.	ලබාදෙන්නේ නම් පමණක් එකඟ වියහැකි බව.	පරිච්ඡේදයේ 12.2.3 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	2021 අප්‍රේල් 01 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරුවල වැඩබැලීම සඳහා පත්කළ නිලධාරිණියන් සඳහා ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12.5.3 වගන්තිය අනුව වැඩබලන තනතුරුවල ආරම්භක වැටුප හා නිත්‍ය තනතුරේ අදාළ ආරම්භක වැටුපත් අතර, වෙනස වැඩ බැලීමේ දීමනාව වශයෙන් ගෙවීම් අනුමත කර තිබුණි. නමුත් මෙම නිලධාරීන් නිත්‍ය තනතුරෙහි කිසිදු රාජකාරියක් සිදුනොකරන අතර, වැඩ බලන තනතුරෙහි පූර්ණකාලීනව රාජකාරි ඉටුකරන බැවින් වැඩ බැලීමේ වැටුපක් ගෙවීමේ පදනම අනාවරණය නොවුණි.	වැඩ බැලීමේ දීමනාව ලෙස වැඩ බලන තනතුරුවල ආරම්භක වැටුපත් නිත්‍ය තනතුරු වලට අදාළ ආරම්භක වැටුපත් අතර වෙනස, වැඩ බැලීමේ දීමනාව ලෙස ගෙවීමට 2022 අප්‍රේල් 01 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත්, ආයතන සංග්‍රහයෙහි 12.6.2 අනුව වන වැඩ බලන තනතුරේ ආරම්භක වැටුප ඉක්මවා නොයන බව.	විධිවිධාන අනුගමනය කළ යුතුය.
(ඇ)	අධිකාරිය සතු රු.23,385,000 ක් වටිනා වත්කම් 07 ක් නිශ්කාර්යව පැවතුණි.	උපයෝජනයට ගැනීමට කටයුතු කරමින් පවතින බව.	උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.31 ධීවර සවිය චක්‍රීය අරමුදල

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ප්‍රතිලාභීන් 13 දෙනෙකුට රු.4,400,000 ක මුදලක් ණය ලෙස ලබාදී තිබූ අතර, එම ප්‍රමාණය මෙන් 4 ගුණයකට අධික ප්‍රමාණයක් ප්‍රතිලාභීන් වෙත ණය ලබා නොදී ස්ථාවර තැන්පතු ලෙස රු.18,690,000 ක මුදලක් චක්‍රීය අරමුදලේ රඳවාගෙන තිබුණි. මේ අනුව චක්‍රීය අරමුදලේ රීති මාලාවේ 5 (I) , (II) හා (III) යන අරමුණු ඉටු වී නොතිබුණි.	බැංකුව ඉල්ලා සිටින ලියකියවිලි හා ඇපකරුවන් සම්පූර්ණ වූ පසුව ණය මුදල කොටස් වශයෙන් ප්‍රතිලාභියාට ලබා දෙනු ලබයි. මෙහිදී යම් ඇපකරුවන්ගේ ගැටලු හෝ වෙනයම් බැංකුව ඉල්ලා සිටින කරුණු කාරණා අනුව ණය මුදල් ලබා දීමට යම් ප්‍රමාද වීම් ඇතිවිය හැකි බව.	අරමුදලේ අරමුණු ඉටුවන ආකාරයට අරමුදල් වැයකළ යුතුය.
(ආ)	පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ සමාලෝචිත වර්ෂයේ ණය ලබාදීමට රු.13,200,000 ක මුදලක් ලබාදී තිබූ අතර, ඉන් රු.4,400,000 ක් පමණක් 2024 දෙසැම්බර් 31 දිනට ණය ලබාදී තිබුණි. මේ අනුව ලද ප්‍රතිපාදනවලින් සියයට 67 ක ප්‍රමාණයක් අදාළ අරමුණ වෙනුවෙන් වැය නොකර චක්‍රීය අරමුදල් ගිණුමේ රඳවාගෙන තිබුණි.	සැම විටම අපගේ මූල්‍ය තත්ත්වයට සුදුසු පරිදි චක්‍රීය ණය අයදුම්පත් අප බැංකුව වෙත ඉදිරිපත් කරනු ලබන බව.	ලැබෙන ප්‍රතිපාදන අදාළ අරමුණ වෙත නිවැරදිව වැය කළ යුතුය.

1.5.32 කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන චක්‍රීය අරමුදල

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ චක්‍රීය ණය යෝජනා ක්‍රමය සඳහාවූ රීති මාලාවේ අංක 03 යටතේ චක්‍රීය ණය යෝජනා ක්‍රමයේ අරමුණු 11 ක් දක්වා තිබුණද, ඉන් අරමුණු 08 ක් ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන චක්‍රීය ණය අරමුදල සඳහා වන අරමුණු දිගකාලීන අරමුණු වන අතර මේ වන විට එම අරමුණු ඉටුකරගැනීම සඳහා අවශ්‍ය මූලික පියවරයන් සිදුකර ගෙන යමින් පවතින බව.	අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ.

1.5.33 වාරිමාර්ග තිරසාර නඩත්තු අරමුදල

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2014 අංක 2 දරන වාරිමාර්ග ප්‍රඥප්තියට අනුකූලව අදාළ අරමුණු වෙනුවෙන්, වාරිමාර්ග තිරසාර නඩත්තු අරමුදලින් මුදල් උපයෝජනය කර නොගෙන සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ස්ථාවර තැන්පතුවල එකතුව රු.69,822,856 ක් ආයෝජනය කර තිබුණි.	2014 අංක 02 දරන අදාළ වාරිමාර්ග ප්‍රඥප්තියට අනුව ප්‍රඥප්තියේ අරමුණු ඉටුකර ගැනීමට ඇති ආදායම් මාර්ග අවහිර වී ඇති හෙයින් හදිසි ආපදා නඩත්තු ගෙවීම් වෙනුවෙන් හා නඩත්තු කටයුතු වෙනුවෙන් මෙම අරමුදල් යෙදවීම සඳහා ආයෝජනය කර ඇති බව.	ප්‍රඥප්තියට අදාළ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.34 සමුපකාර සංවර්ධන අරමුදල

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 43 (1) වගන්තිය හා 1973 සමුපකාර රීති මාලාවේ 43 (ii) ප්‍රකාරව සෑම ලියාපදිංචි කළ සමිතියක්ම රෙජිස්ට්‍රාර්වරයා විසින් නියාමනය කරන ලද පරිදි වාර්ෂික ශුද්ධ ලාභයන් සියයට 10 කට වැඩි නොවන සහ රු.500 ට අඩු නොවන මුදලක් වශයෙන් බැර කරන ලද දායක මුදලින් සමුපකාර අරමුදල සෑදී ඇති වුවද, අදාළ සමිති හඳුනාගෙන නිදහස් නොකළ රු.99,206,271 ක උසාවි දඩ ශේෂයක් නීත්‍යානුකූල නොවන ලෙස සමුපකාර අරමුදලේ පැවතුණි.	උසාවි දඩ මුදල් නිදහස් කිරීමට තොරතුරු අනාවරණය වුවහොත්, එම මුදල් නිදහස් කිරීමට යටත්ව සමුපකාර අරමුදලට බැර කර ඇති බව.	1972 අංක 05 දරන සමුපකාර සමිති පනත යටතේ 43 (1) වගන්තිය හා 1973 සමුපකාර රීති මාලාවේ 43 (ii) ප්‍රකාරව කටයුතු කළ යුතු අතර උසාවි දඩ සමුපකාර සංවර්ධන අරමුදලට බැරකිරීම නොකළ යුතුය.

(ආ)	සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අවස්ථා 03 කදී සහභාගිවූ තායිලන්ත සංචාරය, මැලේසියානු සංචාරය හා ෆීජිත් සංචාරය වෙනුවෙන් සමුපකාර අරමුදලින් රු.701,568 ක් වීසා ලබාගැනීමට හා පරිස්කාර දීමනා වශයෙන් ගෙවා තිබුණද සහභාගිවූ පුහුණු වැඩසටහන කුමක්ද, ඒ සඳහා විධිමත් ආරාධනයක් විදේශීය රටකින් ලැබී තිබේද, ලබාගත් දැනුම සමුපකාර සංවර්ධනය සඳහා උපයෝගීකරගත හැකි ද, සංචාරයට සහභාගී වූ නිලධාරීන් තමන් ලබාගත් දැනුම හා අත්දැකීම් අනෙකුත් නිලධාරීන්ට ලබාදීමට පියවර ගත් බව සනාථ කිරීමට තොරතුරු නොමැති බැවින් මෙම වියදම් සමුපකාර අරමුදලේ අරමුණුවලට පටහැනිව දරා තිබුණි.	එම සංචාරයන් සමුපකාර ව්‍යාපාරය හා සම්බන්ධ විදේශ අධ්‍යයන වැඩ සටහන් වන බැවින් පරිස්කාර දීමනා අරමුදලින් ගෙවා ඇත. අධ්‍යනය වාර්තා හා ව්‍යාපෘති වාර්තා ලබාදීමට උපදෙස් දී ඇති බව	විදේශ සංචාරය සඳහා සහභාගී වූ නිලධාරීන් නිරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, අවශ්‍ය විස්තර ලිපිගොනු ලේඛන ආයතනය පවත්වා ගත යුතුය.
(ඇ)	2008 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ සමුපකාර අරමුදලින් රු.47,310,171 ක් සමිති 11 ක් සඳහා ණය වශයෙන් ලබාදී තිබූ අතර එයින් 2024 ජනවාරි 01 දිනට රු.14,721,914 ක අයවිය යුතු ණය ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.5,504,559 ක ණය ශේෂයක් අයකරගෙන තිබුණද, එම ණයවලට කිසිදු පොළියක් අය කර ගෙන නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ලබාදී ඇති ණය සඳහා ගිවිසුම් ප්‍රකාර පොළිය අයකර ගත යුතුය.

1.5.35 වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය අරමුදල

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1990 අංක 02 දරන වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍ය අරමුදල පිළිබඳ ප්‍රඥප්තියේ 06 වන වගන්තිය අනුව අරමුදලේ මුදල් යොදවනු ලැබිය හැකි කාර්යයන් ලෙස වයඹ පළාත තුළ දරිද්‍රතාවයට සහන සැලසීම, වයඹ පළාතේ අධ්‍යාපනය හෝ ඥානය වර්ධනය කිරීම, වයඹ පළාත තුළ ආගම නංවාලීම හා වයඹ පළාත වෙනුවෙන් සේවයක් කර ඇති තැනැත්තන්හට ප්‍රදානයක් කිරීම සඳහා හෝ වයඹ පළාතේ මහජනතාවගේ සුභසිද්ධිය හෝ යහපත පිණිස වෙනත් යම් කාර්යයන් සඳහා යෙදවිය යුතු වුවද, ඉකුත් වර්ෂයන්හිදි මෙන්ම සමාලෝචිත වර්ෂය තුළ දී ද වෛද්‍යාධාර ගෙවීම් හැර අරමුදල් යොදවාගත හැකි වෙනත් කිසිදු කාර්යයන් සඳහා ප්‍රධාන අමාත්‍ය අරමුදල වැය කර නොතිබුණි.	මේ වන විට රෝගීන් සඳහා ආධාර ලබාදීම,අධ්‍යාපන කටයුතු සඳහා ආධාර ලබාදීම සහ ක්‍රීඩා කටයුතු සඳහා ආධාර ලබාදීම යන කාරණා සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් කටයුතු කරන බව.	අරමුදලේ එක් කාර්යයකට පමණක් සීමා නොවී කාර්යයන් ඉටුකිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රඥප්තියේ 5(2) වගන්තිය අනුව අරමුදලට විවිධ වෙනත් ප්‍රභවයන්ගෙන් අරමුදල් සපයාගත හැකි බව සඳහන් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළ වෙනත් ප්‍රභවයන්ගෙන් රු.2,900 ක් එනම් මුළු ආදායමින් සියයට 0.058 ක් මගින් පමණක් ලබාගෙන තිබුණ අතර, ඒ අනුව මුළු ලැබීම් වලින් සියයට 99.042 ක ප්‍රමාණයක් එනම් රු.මිලියන 05 ක් ම පළාත් සභා උපමාන පාදක ලැබීම් යටතේ ලබා දී තිබූ නමුත්, වෙනත් විවිධ ප්‍රභවයන්ගෙන් අරමුදලට මුදල් එකතු කරවා ගැනීමට උත්සාහයක් ගෙන නොතිබුණි.	ප්‍රඥප්තිය ප්‍රකාරව වෙනත් ප්‍රභවයන්ගෙන් අරමුදල් සපයා ගැනීමට කටයුතු කිරීම යටතේ එක් පියවරක් ලෙස වයඹ පළාත් රාජ්‍ය සේවයේ නියුතු රාජ්‍ය නිලධාරීන්ගේ ස්ව කැමැත්ත අනුව මාසිකව සිය මාසික වැටුපෙන් රු.50 ක මුදලක් අරමුදලට පරිත්‍යාග කිරීමේ වැඩසටහන මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතින බව.	ප්‍රඥප්තිය ප්‍රකාරව වෙනත් ප්‍රභවයන්ගෙන්ද, අරමුදල් සපයා ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	2022 වර්ෂයේ දී ප්‍රතිලාභීන් 47 කට ද, 2023 වර්ෂයේ දී ප්‍රතිලාභීන් 35 කට ද ප්‍රධාන අමාත්‍ය අරමුදලින් වෛද්‍යාධාර, ලබා දී තිබුණ අතර, සමාලෝචිත වර්ෂයේදී වෛද්‍යාධාර 08 ක් පමණක් ලබා දී තිබුණි. එයින් වෛද්‍යාධාර ගෙවීම් 04 ක් ඉකුත් වර්ෂයේ ඉල්ලීම් වන අතර, ඉතිරි 04 පමණක් සමාලෝචිත වර්ෂයේ ප්‍රතිලාභ ඉල්ලීම් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දී ප්‍රධාන අමාත්‍ය අරමුදලේ ප්‍රතිලාභ ලබා දීමේ අඩුවීමක් පැවතුණි.	ප්‍රධාන අමාත්‍ය අරමුදලින් ආධාර ලබාදීමේ නිර්ණායකයන් සකස් කරනු ලබන්නේ ගරු වයඹ පළාත් ආණ්ඩුකාරතුමා ප්‍රමුඛ ප්‍රධාන අමාත්‍ය අරමුදල් පාලක මණ්ඩලය මඟින් වන අතර වරින් වර සේවා අවශ්‍යතාවය මත එම නිර්ණායකයන් වෙනස්වීම නිසා ගෙවීම් කිරීමේ හැකියාව අඩුවූ බව සඳහන් කර ඇත. එහිදී නිර්ණායකයන්ට අනුකූල නොවීම හේතුවෙන් ඉල්ලුම්පත් විශාල වශයෙන් ප්‍රතික්ෂේප විය. එයට පිළියමක් වශයෙන් මේ වන විට ආධාර ලබාදීමේ නිර්ණායකයන් සංශෝධනය කර ඇති බව.	වරින් වර නිර්ණායක වෙනස් කිරීමට කටයුතු නොකර අනුමත විධිමත් නිර්ණායක මත වාර්ෂිකව උපරිම ප්‍රතිලාභ වයඹ පළාත් මහජනතාවට ලබා දීමට කටයුතු කළ යුතුය.

1.5.36 වයඹ පළාතේ නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදල

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරී අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අරමුදල සතු තිරසර පුරවර අදියර vi හා අදියර viii යටතේ මිලදීගත් ඉඩම් වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 වන විට රු.33,440,145 ක වියදමක් දරා තිබුණද 2024 වර්ෂය අවසන් වන විට ඉඩම් කොටස් අලෙවිකර ගැනීමට සුදුසු තත්ත්වයට ඉඩම් සංවර්ධනය කරගැනීමට නොහැකිව පැවතුණි.	අධිකාරියේ පාලනයෙන් පරිබාහිර ආයතන හා පුද්ගලයින් සමඟ ඒකාබද්ධව සංවර්ධන කටයුතු සිදු කළ යුතුව පවතින බැවින් විගණනය විසින් පෙන්වා දී ඇති තත්ත්වය පැන නැඟී ඇති බව	සැලසුම් කළ පරිදි අරමුදලේ අරමුණ ඉටුකිරීම සඳහා කඩිනම් පියවර ගනිමින් සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුය.
(ආ)	තිරසර පුරවර අදියර vi යටතේ පවත්නා ඉඩමෙහි රු.1,301,811 ක වියදමක් දරා 2024 වර්ෂය තුළ අපජල කාණු පද්ධතිය ඉදිකිරීම සිදුකර තිබුණු අතර ඉඩම් කොටස් දෙකක කාණු මට්ටම දක්වා පස් පිරවීමට සිදුවී තිබීමෙන් ඒ සඳහා වන පිරිවැයද දැරීමට තිබියදී කැබලි අංක 07 හා 08 සඳහා පෙර තක්සේරු වටිනාකම මත පදනම්ව 2023 හා 2024 වර්ෂවලදී	විකුණුම් මිල තුළ බිම්කොටස් වෙනුවෙන් දරන ලද හා තවදුරටත් දැරීමට සිදුවේතැයි අපේක්ෂිත වියදම මත සියයට 25 ක ලාභාන්තියක් අන්තර්ගතකර ඇති බැවින් ඉතිරි බිම්කොටස්වල මිල ඉහල යාමක් සිදුනොවන බව.	බිම් කොටස් මිල ගණන් වඩාත් නිවැරදිව ගණනය කිරීම සඳහා විකිණීමට පෙර බිම් කොටස් විකිණිය හැකි තත්ත්වයට පත්කිරීමට කටයුතු කළ යුතුය.

රු.2,000,000 ක අත්තිකාරම් ගෙවා, වෙන්කරවා ගැනීමට කටයුතු කර තිබුණි. සංවර්ධන කටයුතු අවසන් වීමෙන් පසුව ඒ සඳහා යන වියදම එම අත්තිකාරම ගෙවා වෙන්කර ඇති කොටස් වෙනුවෙන් එකතු කිරීමට නොහැකි වීමෙන් ඉතිරි බිම් කොටස්වල මිල ගණන් ඉහල යාමට ඉඩකඩ පැවතුණි.		

1.5.37 සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සමුපකාර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ කටයුතු පරිගණක ගත කිරීම සඳහා නව පරිගණක මෘදුකාංගයක් හඳුන්වා දී ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා යෝජනා ක්‍රමය ආරම්භයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා මාසික දායක මුදල් හා සමිති දායක මුදල් ගිණුම්ගත කිරීමට තිබූ බවත් ඒ අනුව ඇතුළත් කළ යුතු මුළු දත්ත ප්‍රමාණය 666,000 කට ආසන්න අගයක් ගන්නා බව යෝජනා කරමින් එම දත්ත ඇතුළත් කිරීම වෙනුවෙන් මාණ්ඩලික පත්‍ර අංක 76/2023/03/-03 මඟින් යෝජනා අනුමත කරගෙන තිබුණද මෙම අරමුදලේ දෛනික රාජකාරියේ කොටසක් වන මෙම කර්තව්‍ය සඳහා දත්ත 236,020 ක් ඇතුළත් කර පරීක්ෂා කරන නිලධාරීන් වෙනුවෙන් රු.188,764 ක් අරමුදලේ මුදල් භාවිතා කරමින් ගෙවීම් කර තිබුණි.	දිනෙන් දින විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ කටයුතු සංකීර්ණ වීම හේතුවෙන් හා සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා විසින් පවරා ඇති නිත්‍ය රාජකාරී හේතුවෙන් සාමාන්‍ය රාජකාරී වේලාවන් තුළදී පැරණි දත්ත පරිගණක පද්ධතිය වෙත ඇතුළත් කිරීමට නොහැකි වූ අතර රාජකාරී වේලාවලින් පසුව හා නිවාඩු දින වලදී මෙම කර්තව්‍ය සිදු කිරීමට කටයුතු කර ඇති බව.	පැවරී ඇති දෛනික රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් වැටුපට අමතරව වෙනත් දීමනා නොගෙවිය යුතුය.

1.5.38 වයඹ දිරිය චක්‍රීය ණය යෝජනා ක්‍රමය

විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 ජනවාරි 23 දින සිට 2024 ඔක්තෝබර් 30 දක්වා වයඹ දිරිය චක්‍රීය ණය යෝජනා ක්‍රමය යටතේ නිකුත් කර තිබුණු ණයගැතියන් 14 දෙනෙකුගේ ණය මුදල් සඳහා ආරම්භක දිනයේ සිටම කිසිදු ණය වාරිකයක් හෝ පොළිය ගෙවීමට කටයුතු කර නොතිබුණි. මේ අනුව දෙපාර්තමේන්තු මූලධනයෙන් රු.3,600,000 ක ණය මුදල් නිදහස් කිරීම් සඳහා ණය කමිටුව අනුමැතිය ලබාදීමේදී සලකා බලන ලද නිර්ණායකයන්ගේ දුර්වලතාවයක් පැවතුණි.	"වයඹ දිරිය" ණය යෝජනා ක්‍රියාත්මක කිරිම සඳහා දැනට ණය කමිටුවක් ස්ථාපනය කර නොමැත . කලාප භාර නිලධාරීන්ගේ නිර්දේශ මත දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත කර බැංකුව වෙත යොමු කිරිම දැනට සිදු කරනු ලබන බව.	ණය කමිටුව ස්ථාපනය කර අදාළ නිර්ණායකයන් යාවත්කාලීන කළ යුතුය.